# ඉමාම් අල් නවවිගේ හදීස් වදන් 40 පිළිබඳ විවරණය - අවසාන කොටස

[ සිංහල – Sinhala – سنهالي ]


මහාචාර්ය ජමාල් අහමද් බදී
පොදු අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාත්‍යන්තර ඉස්ලාමීය විශ්වවිද්‍යාලය
මැලේෂියාව


සිංහල පරිවර්තනය

ජාසිම් ඉබ්න් දඉයාන්


2014 - 1435

IslamHouse.com

# شرح الأربعين النووية

## الجزء الأخير

« باللغة السنهالية »

د/ جمال أحمد بادي

ترجمة: **جاسم بن دعيان**

2014 - 1435

IslamHouse.com

# 37. ක්‍රියාවන් ලේඛන ගත වීම

අල්ලාහ් තආලා වදාළ බව මුහම්මද් නබි (සල්) තුමාණන් විසින් ප්‍රකාශිත හදීසයක් ඉබ්නු අබ්බාස් (රළි) තුමා මෙසේ වාර්තා කරයි. "සැබැවින් ම අල්ලාහ් තආලා කෙනෙකුගේ යහපත් ක්‍රියා සහ අයහපත් ක්‍රියා ලේඛන ගත කරයි. මේ ගැන විස්තරයක් ඔහු විසින් ප්‍රකාශයට පත් කර ඇත."

නබි (සල්) තුමාණන් පහදා දුන්නේ මෙසේය. "කවරෙකු හෝ යහපත් ක්‍රියාවක් කිරීමට අදහස් කළ නමුදු ඔහු විසින් එය ඉටු නොකළේ නම්, අල්ලාහ් තආලා (ඔහුගේ හොඳ චේතනාව නිසා) එය සම්පූර්ණ කුසල් කර්මයක් ලෙස තමා වෙත ලේඛන ගත කරයි. කෙනෙකු යහපත් ක්‍රියාවක් කිරීමට අදහස් කර එය ඉටු කළේ නම්, අල්ලාහ් තආලා ඔහුගේ ඒ යහපත් ක්‍රියාව දහයේ සිට හත්සිය වරක් හෝ ඊට වැඩි වාර ගණනක් (ඔහු විසින් ඉටු කළා වූ) කුසල් කර්මයන් සේ සලකා ඒවා තමා වෙත ලේඛන ගත කරයි. කෙනෙකු අයහපත් ක්‍රියාවක් කිරීමට අදහස් කර එය නොකළේ නම් එය සම්පූර්ණ කුසල් ක්‍රියාවක් සේ සලකා අල්ලාහ් තආලා තමා වෙත එය ලේඛන ගත කරයි. කෙනෙකු අයහපත් ක්‍රියාවක් කිරීමට අදහස් කර එය කළේ නම්, එය එක් අකුසලයක් ලෙස (පාප

ක්‍රියාවක් සේ) සලකා තමා වෙත ලේඛන ගත කරයි.'' මූලාශ්‍ර සහීහ් බුහාරි සහ සහීහ් මුස්ලිම්.

ඉමාම්වරු දෙදෙනාම මේ හදිසය පිළිබඳ ව මෙලෙස විග්‍රහ කරති.

"එබැවින් සහෝදරයාණනි! අති උතුම් අල්ලාහ් අපහට උදව් කරත්වා. අල්ලාහ්ගේ කරුණාව කෙතරම් විශාලදැයි සිතා බලනු මැනව. අල්ලාහ් "තමා වෙත'' ලෙස සඳහන් කරනුයේ ඒ පිළිබඳව දක්වන සැලකිලි කෙතරම් දැයි මෙනෙහි කර බලන්න. "සම්පූර්ණ කුසල්'' යනුවෙන් සඳහන් කරනුයේ අවධාරණය කරනු පිණිසය. පාප ක්‍රියාවක් අදහස් කරන නමුත් සිදු නොකිරීම ගැන පවසන විට අල්ලාහ් එය සම්පූර්ණ (කාමිලා) කුසල් කර්මයක් ලෙස තමා වෙත ලේඛන ගත කරන බව සඳහන් කරන නමුත් පාපයක් කළේ නම්, එය එක් පාපයක් ලෙස ලේඛන ගත කරන බව පවසයි. මෙහි දී "සම්පූර්ණ'' අකුසලක් ලෙස කිසිසේත්ම සඳහන් වී නැත. සියලු ප්‍රශංසා හා කීර්තිය අල්ලාහ් ට හිමි වේවා. ඔහු විසින් පිරිනමන ලද භාග්‍යයන් ගණන් කළ නොහැකි අතර, සියලු ජය අල්ලාහ් සතුය.''

පසුබිම

මෙම හදීසියේ වදන් පැහැදිලි ව නොදැක් වූ නමුත්, මෙය හදීස් අල් කුද්සි ලෙස සැලකේ. ක්‍රියාවන් ලේඛන ගත කෙරෙන්නේ කෙසේදැයි

මුහම්මද් (සල්) තුමාණන් පැහැදිලි කර දුන් ආකාරය මෙහි සඳහන් වේ. මෙම හදිසය පවසන කරුණු අල් බුහාරි වෙනත් ආකාරයකින් පැහැදිලි ව සඳහන් කර ඇත. ඒවායින් එකක් ඉබ්නු රජබ් තුමා මෙසේ විග්‍රහ කර ඇත. සියලු කීර්ති හිමි අල්ලාහ් ඔහුගේ මලාඉකාවරුන්ට මෙසේ අණ කරයි.

"මගේ ගැත්තා පාප කර්මයක් කිරීමට අදහස් කළේ නම්, ඔහුට එරෙහි ව එය ලේඛන ගත නොකරනු. ඔහු එය සිදු කළේ නම්, එය එක පාප කර්මයක් ලෙස ලේඛන ගත කරනු. ඔහු යහ කර්මයක් කිරීමට අදහස් කර එය නොකළේ නම්, එය යහ කර්මයක් ලෙස ඔහුට ලේඛන ගත කරනු. ඔහු එය සිදු කළේ නම් එය යහ කර්ම දහයක් ලෙස ලේඛන ගත කරනු." මූලාශ්‍ර ඉමාම් මුස්ලිම්.

හදීස් වදනෙ හි සඳහන් වී නොමැති නම්, මෙය කුද්සි හදීසයක් ලෙස වර්ග කරන්නේ කෙසේ දැයි ප්‍රශ්නයක් පැන නගී. යහ ක්‍රියා කුසලතාවෙන් අධික වන බව ද පාප ක්‍රියාව එක පාපයක් ලෙස සැලකෙන බවද ඉස්ලාම් පවසයි. සූරා බකරා වාක්‍ය අංක 245 සහ 261 ද සූරා නූර් වාක්‍ය අංක 40ද සූරා අල් අනාම් වාක්‍ය අංක 160 මේ බව සනාථ කරයි.

*"යහ ක්‍රියාවක් සමඟ කවරෙකු අල්ලාහ් අභියස පැමිණෙන්නේද එය මෙන් දහ ගුණයක් ඔහුට කුසල් දෙනු ලබයි. කවරෙකු පාපයක් සමඟ*

*පැමිණෙන්නේනද, ඔහුට එය හා සමාන මිස වෙනත් කිසිවක් දෙනු නොලැබේ. යැයි අල්ලාහ් පවසයි.”*

මෙයින් ඉගෙන ගන්නා පාඩම

ඉහත සඳහන් කළේ පොදු නීතියයි. එහෙත් විවිධ හේතු සාධක මත ඇතැම් පාපයන් බරපතළ බව සැලකෙන අවස්ථාවන්හි මෙම නීතිය වෙනස් වේ. අෂ් ෂුහුර් අල් හුරුම් නම් විශේෂ මාස හතර වැනි කාලයේ සහ මක්කා වැනි තහනම් පළාතෙහි සිදු වන පාපයද මෙහි උදාහරණය වේ. ඉබ්න් අබ්බාස් (රලි) සහ කතාදා (රලි) යන අයගේ මතයද මෙයයි.

මක්කාව පිළිබඳ ව සූරා හජ් වාක්‍ය අංක 25හි අල්ලාහ් මෙසේ පවසයි.

*“(මස්ජිදුල් හරම්) එහි අපරාධ කරමින් කවරෙකු දැඩිභාවය අපේක්ෂා කරන්නේ ද ඔහුට වේදනීය දඬුවම භුක්ති විඳවන්නට සැලැස්වුයෙමු.”*

මෙම වාක්‍ය මත, ඇතැම් සහාබාවරු මක්කාවේ සීමාව තුළ ඇතැම් ක්‍රියාවන් කිරීමෙන් වැළකී සිටියහ.

කුලින පංතියට අයත් කෙනෙකු සිදු කරන පාපයේ බරපතළකම අධික බව සැලකේ. අල්ලාහ් සහ ඔහුගේ ගුණාංගය පිළිබඳ ව දැනුම ලත් කෙනෙකු අල්ලාහ්ට සමීපවන අතර පාපයක් කිරීමෙන් ඔහු වැළකී සිටිය යුතු බව ඉමාම් ඉබ්නු රජබ් පවසයි.

එවැනි කෙනෙක් පාපයක් කළේ නම්, ඔහුගේ ක්‍රියාව සාමාන්‍ය කෙනෙක් කළ පාපයට වඩා විශාල බව සලකනු ලැබේ.

මෙම හදීසයේ කරුණු හතරක් සඳහන් වී ඇත.

1. යහ ක්‍රියාව - කුසල් අධික වීම එහි ප්‍රතිඵලය වේ.
2. පාප ක්‍රියාව - එහි ලේඛන ගත වීම එක් පාපයක් ලෙසයි.
3. යහ ක්‍රියාවක් කිරීමට අපේක්ෂාව - සෑම අපේක්ෂාවක් ම එය ඉටු නොකළත් එක් කුසල් ක්‍රියාවක් ලෙස ලේඛන ගත වේ. මෙහි අපේක්ෂාව යනු ඵලක් නොමැති සිතුවිලි නොව දැඩි ආශාව සහ අධිෂ්ඨානය බව සලකන්න.

මේ පිළිබඳ ව ඉමාම් ඉබ්නු රජබ් නිදසුන් කිහිපයක් සඳහන් කර ඇත.

- තහජ්ජද් සලාහ් ඉටු කිරීමට සිතෙ හි අධිෂ්ඨානය තැබූ කෙනෙක්, අධික නින්දට පත් ව, වෙලාවට අවදි නොවීම.

- වෛකල්පිත නැමදුම හෝ උපවාසය සඳහා චේතනය කළ කෙනෙක්.

- ජිහාද් හෝ උම්රාවෙ හි යෙදෙන්නට චේතනා තැබූ කෙනෙක්.
- හජ් ඉටු කිරීමට චේතනා තැබූ කෙනෙක්.

මෙවැනි විෂයයන් පිළිබඳ ව මුස්ලිම්වරයෙක් දැඩි අධිෂ්ඨානයක් තැබුවහොත්, එය ඔහු වෙනුවෙන් යහ ක්‍රියාවක් ලෙස ලේඛන ගත වේ. එහෙත් අවස්ථාවක් ලැබූ විගස එය ඉටුකිරීමේ වගකීමෙන් ඔහු බැහැර නොවෙයි.

4. වරදක් සිදු කිරීමට අදහස් කිරීම හෝ චේතනාවෙන් තොර ව පාපයක් කිරීම. ඇතැම් මුස්ලිම් විද්වතුන් මෙය චේතනාව හා සම්බන්ධ කරති. මෙහි චේතනාව හා තීරණය අතර අවුලක් සිදු වේ. එයට හේතුව කෙනෙක් තීරණයට එළඹෙන විට චේතනාව මුල් තැන ගනී.

යම් මාතෘකාවක් යටතේ එකක ට වැඩි හදීස් වාර්තා තිබේ නම් ඒවායෙ හි නිවැරදි අර්ථය පිළිබඳ ව නිගමනයට බැසීම සඳහා හදිස් විද්වතුන් වාර්තා සියල්ල සසඳා බලති. අබූ හුරෙයිරා (රලි) වාර්තා කළ තවත් හදිසයක් දෙස බලන්න. “කෙනෙක් අල්ලාහ් කෙරෙහි ඇති බිය හේතුවෙන් පාපයක් කිරීමෙන් වැළකී සිටියේය.” පාපයක් කිරීමට අදහස් කර, එය කිරීමට හැකියාවක් තිබිය දීත් අල්ලාහ්

කෙරෙහි ඇති බිය හේතුවෙන් එය අත හැර දැමූ කෙනෙක් පිළිබඳව මෙම හදීසය සඳහන් කරන බව ඉමාම් ඉබ්නු රජබ් පවසයි. තවද, එම මිනිසා ඒ සඳහා ත්‍යාග ලබනු ඇත. පාපයක් නොකිරීම හසනා යහ ක්‍රියාවක් වන අතර, පාපයක් ඉටු කිරීමෙන් වැළකීම කුසල් ක්‍රියාවක් බව ඉමාම් වරයා පහදා දෙයි.

මෙය සිදු වන විවිධ අවස්ථාවන් ගැන ඉමාම් වරයා සඳහන් කරයි.

1. පාපයක් කිරීමට අදහස් කරන කෙනෙක් ජනයාට බියෙන් හෝ අන් අයගේ දෝෂාරෝපණය ට ලක් වීමට අකැමැති නිසා එය ඉටු නොකරයි. මේ මිනිසා දඬුවම් ලැබිය යුතු බව ඇතැම් විද්වතුන් අදහස් දක්වන බව ඉමාම් ඉබ්නු රජබ් පවසයි.

2. පාපයක් කිරීමට අදහස් කරන කෙනෙක්, බාහිර හේතුන් නිසා එය ඉටු නොකරයි. උදාහරණයක් වශයෙන්, කෙනෙක් සොරකම් කිරීමට අදහස් කළ නමුත් පොලිස් වාහනය දැක එතැනින් පලා යයි. මේ තැනැත්තා පාපයක් නොකළ නමුත් දඬුවම් ලබන බව ඇතැම් විද්වතුන් අදහස් දක්වති.

3. පාපයක් කිරීමට පියවර ගත් නමුත්, කායික ශක්තිය හෝ හැකියාව නොමැති කෙනෙක්, ඔහු දඬුවම් ලබන බව විද්වතුන් පවසති. නිදසුනක් වශයෙන් එකිනෙකා ඝාතනය කිරීමේ අරමුණින් රණ්ඩු දබර වූ මුස්ලිම්වරු දෙදෙනෙක් දෙස බලමු. එයින් කවරෙකු මරණයට ලක් වුවත්, දෙදොම අපාය ගත වන බව හදිසයක් පවසයි. එම හදීසයට සවන් දුන් සහාබාවරු, "මෙය (දඬුවම) ඝාතනය කළ තැනැත්තාටය. ඝාතනයට ලක් වූ අසරණයාට එම දඬුවම් දීම සුදුසු වන්නේ කෙසේදැ?යි" විමසූහ. එවිට "ඝාතනයට ලක් වූ මිනිසා ද තම මිත්‍රයා හෝ සහෝදරයා ඝාතනය කිරීමේ අරමුණින් පැමිණි නමුත් එය ඉෂ්ට කිරීමට ඔහුට නොහැකි විය." යනුවෙන් නබි (සල්) තුමාණන් පහදා දුන්හ.

4. පාපයක් කිරීමට අදහස් කළ කෙනෙක් ඒ පිළිබඳ ව තවත් කිහිප දෙනෙක් සමඟ සාකච්ඡා කළ නමුත්, ඔහු එම පාපය ඉටු කළේ නැත. ඔහුගේ අයහපත් චේතනාව සඳහා ඔහු දඬුවම් ලබන බව ඇතැම් විද්වතුන් අදහස් දක්වති. ඔහු අයහපත් චේතනාව මත දඬුවම් නොලබන බවද, ඔහු අනුමත කළ නොහැකි අවලාද පැතිරීම,

කෝලාම් කීම, චරිත ඝාතනය වැනි කතා පැතිරුවේ නම් පමණක් ඔහුට දඬුවම් ලබන බව තවත් පිරිසක් අදහස් දක්වති.

5. කෙනෙක් පාපයක් සිදු කිරීමට අදහස් කළ නමුත් පාපය කිරීමට ඔහු තුළ තිබූ මහත් ආශාව හීන වීමෙන් එය සිදු කිරීමට පෙර තම සිත වෙනස් කරගත්තේය. එවැනි පුද්ගලයා දඬුවමට ලක් වන්නේ දැයි නැගෙන ප්‍රශ්නයට ඉමාම් ඉබ්නු රජබ් මෙසේ පිළිතුරු දෙයි.

    a. පාපයක් කිරීමේ චේතනාව සිතුවිල්ලකට පමණක් සීමා කළ කෙනෙක්, ඔහු ඒ පිළිබඳව කිසිදු පියවරක් නොගත් අතර එම පාපය කිරීම ඔහු වහාම අප්‍රිය කරයි. මෙම මිනිසා අල්ලාහ්ගේ සමාව ලබන බව ඉමාම් ඉබ්නු රජබ් පවසයි. උදාහරණයක් ලෙස රමදාන් මාසයේ උපවාසයේ යෙදුනු කෙනෙක් සිසිල් ජලය දැක, මොහොතකට එය පානය කිරීමට ආශා කර, වහාම එම සිතුවිල්ල ඉවත් කර ගනී. පාපයක් කිරීමේ චේතනාවකින් තොර වූ මෙම පුද්ගලයා ක්ෂමාව ලබයි.

b. අයහපත් කරුණක් ගැන නිතර කල්පනා කරමින් සිටින කෙනෙක් වර්ග දෙකකට අයත් බව විද්වතුන් පවසති.

- හදවතේ ප්‍රශ්නයක්: එනම් අල්ලාහ්ගේ ඒකීය භාවය, නබිත්වය, අවසාන දිනය වැනි කරුණු පිළිබඳව සැකය කෙනෙකුගේ සිතෙහි නැගුනේ නම්, එම තැනැත්තා දඬුවම් ලබන බව විද්වතුන් අදහස් දක්වති. ඉමාම් ඉබ්නු රජබ් මේ ගැන තවත් විග්‍රහ කරයි. එනම්, අල්ලාහ් කැමති දේ මිනිසා අප්‍රිය කරන්නේ නම්, අල්ලාහ් අප්‍රිය කරන දේ මිනිසා ආශා කරන්නේ නම්, උඩඟුව, වෛරය, අහේතුවෙන් සැක කිරීම යන දේ සඳහා මිනිසා දඬුවම් ලබයි.

- ශාරීරිකව කරන පාපයක්: එනම් කාම මිථ්‍යාචාරය, සොරකම් කිරීම, මත් පැන් හෝ මත් ද්‍රව්‍ය භාවිත කිරීම, මිනිස් ඝාතන යන පාපයන් පිළිබඳ ව ඉමාම් ඉබ්නු රජබ් අදහස් දක්වන්නේ මෙසේය. මේ මිනිසා දිගින් දිගට මේ පාපයන් පිළිබඳ ව කල්පනා කරමින් එය ඉටුකිරීමට මහත් ආශාවෙන් හා කැමැත්තෙන් සිටින්නේ නම් ඔහු දඬුවම් ලබයි. මේ මිනිසා එය

සැබැවින් ම ඉටු නොකළ නිසා ඔහු සමාව ලබන බව තවත් විද්වතුන් පිරිසක් පවසති. මේ හා සමාන අදහස් දරන තුන් වන පිරිස, මෙම මිනිසා හරම් පෙදෙසෙ හි මෙවැනි සිතුවිල්ලෙන් පසු වුයේ නම් ඔහු දඬුවම් ලබන බව පවසති.

පාපයක් කළ කෙනෙක් ඉන් පසු ව හැකි සෑම අවස්ථාවකම එය නැවත ඉටු කිරීමට සූදානම් ව සිටියි. මේ මිනිසා දිගින් දිගට අකීකරු වන අයෙකි. ඔහුගේ පාප ක්‍රියා දෙකක් අතර දීර්ඝ කාලයක පරතරයක් තිබුණ ද ඔහුගේ අයහපත් චේතනාව හේතුවෙන් ඔහු දඬුවම් ලබයි.

මෙම හදීසයේ තවත් වාර්තාවක, කෙනෙක් පාපයක් කළේ නම් එය එක් පාපයක් ලෙස අල්ලාහ් ලේඛන කරන බවද, එම තැනැත්තා පාප ක්ෂමාව කළේ නම් හෝ යහ ක්‍රියාවන් ඉටු කළේ නම්, එම පාපයට සමාව දෙන බවද අල්ලාහ් පවසයි. 18 වන හදිසය සඳහන් කරන අයුරින් “ඔබ සැම, කොතැනක සිටියත් අල්ලාහ්ට බිය බැතියෙන් කටයුතු කරනු. ඔබගෙන් අකුසල් ක්‍රියාවක් සිදු වු විට, පෙරළා පසුව කුසල් ක්‍රියාවක් කරනු. මෙම කුසල් ක්‍රියාව ඔබෙන් සිදු වූ අකුසල් ක්‍රියාව මකා දමන්නේය. තවද අන්

අය සමඟ විනීත ලෙස හැසිරෙනු.” යන වදන මෙයට අදාල වේ.

අවසාන නිගමනය

රැකවරණය නොලැබූ කෙනෙක් මහත් පාඩුවට ලක් වූ බව මෙම හදීසයේ එක් අනුවාදයක් සඳහන් කරයි. මෙහි අදහස වන්නේ කවරෙකුගේ අකුසල් ක්‍රියාවන් ඔහුගේ කුසල් ක්‍රියාවන් ඉක්ම වන්නේද ඔහු අන්ත පරාජයට පත්වුණේය යනුවෙන්ය. අල්ලාහ්ගේ මෛත්‍රිය සහ අනුග්‍රහය ඉතාමත් විශාලය. ඔහු කැමති අයට කුසල් ක්‍රියාවන්ට 700 වාරයක් ත්‍යාග පිරිනමා ඔවුන්ගේ පාපයන්ට සමාව ද දෙයි. මෙවැනි සියලු අවස්ථාවන් අල්ලාහ් සකසා තිබිය දී අපි තව තවත් ඔහුට අකීකරු ව පාපයන් කිරීමෙහි නියැළී සිටියේ නම්, අපගේ කුසල් ක්‍රියාවන් ඉක්මවා පාපයන් අධික වීමෙන් අපි මහත් පාපතරයන් සහ සීමාව ඉක්ම වූ අය බවට පත් වෙමු. එවැනි තත්ත්වයේ අපටම මිස අන් කිසිවෙකුට දොස් පැවරිය නොහැක.

“කවරෙකුගේ පාපයන් ඔහුගේ තුසල් ක්‍රියාවන් ඉක්මවන්නේද, ඔහුට විනාශය හිමිවේවා.” යන හදීස් වදන ඉබ්නු මස්ඌද් (රලි) වාර්ථා කරයි. දිනක් මුහම්මද් (සල්) තුමාණන්, “වස්තු භංග වූ තැනැත්තා ලෙස ඔබ සලකන්නේ කවරෙකුද?” යැයි විමසුහ. “දිනාර් හෝ දිර්හමක් නොමැති කෙනෙක්.” යැයි

සහාබාවරු පිළිතුරු දුන්හ. එවිට නබි (සල්) තුමාණන් “කෙනෙක් කඳුමෙන් විශාල ප්‍රමාණයේ කුසල් ක්‍රියාවන් සමඟ පැමිණෙන නමුත්, ඔහු මිනිසුන්ට පහර දීම හා හානි සිදු කිරීම වැනි පාපයන් විශාල ප්‍රමාණයක් සහිත ව ද සිටියි.” ඔහුගේ පාපයන් මිනිස් අයිතිවාසිකම් හා සම්බන්ධ වූ නිසා ඒවා ඉවත දැමිය නොහැක. මේ මිනිසා අන් අයට එරෙහිව, මුසා පතුරා, කේක්ලම් පවසා, සාතන පවා සිදු කර ඇත. මෙවැනි පුද්ගලයාගේ කුසල් ක්‍රියා සියල්ල නිත්‍යානුකූලව පවරා ගනු ලැබේ. එයට අමතර ව ඔහුගේ පාපයන් ට ලක් වූ අය කළ අකුසල් ක්‍රියා සියල්ල ඔහුගේ ලේඛනයට එකතු කරනු ලැබ අවසානයේ ඔහු අපායට වීසි කරනු ලබයි.

මෙවැනි බංකලොත් වූ පුද්ගලයාගේ තත්ත්වය ගැන සිතා බලන්න. මෙම හදිසය පිළිබඳ ව අපි සියලු දෙනාම දීර්ඝව සිතා බලා අන් අයගේ අයිතිවාසිකම් උදුරා නොගෙන ඔවුන් අවමානයට ලක් නොකර, අනිකුත් මුස්ලිම් වරුන් අතරමං නොකළ යුතුය. අපි සතුන්ට පවා කරුණාව දැක්විය යුතුය. බළලෙකුට වදහිංසා කළ කාන්තාවක් අපා ගත වූ බව නබි (සල්) තුමාණන් අවවාද කළහ. තවත් බැතිමත් කාන්තාවක් කුසල් ක්‍රියා කළ නමුත් තම අසල් වැසියන්ට නිතර හිරිහැර කළ හේතුවෙන් අපායට ඇතුළු වූ බව නබි (සල්) තුමාණන් අවවාද කළහ.

අන් අය සමඟ ආශ්‍රය කිරීමේ දී මුස්ලිම්වරුන් ප්‍රවේශමින් ක්‍රියා කළ යුතුය. අප කළ වරදකට ඔවුන්ගෙන් අප සමාව නොපැතුවේ නම්, ඔවුන් කරන වරදට අප වගකිව යුතුයි. මුස්ලිම්වරුන් වශයෙන් මෙය අපගේ යහපත් හැසිරීම හා සම්බන්ධ වේ. මෙලොව හා මරණයෙන් පසු ජීවිතයේ ජය ලබනු පිණිස මෙම විෂය පිළිබඳ ව අප විශේෂ සැලකිලි දැක්විය යුතුය.

## 38. අල්ලාහ්ට සමීප වීම සඳහා වූ ප්‍රධාන දොරටු ව ඔහුට නැමදුම් කිරීමය

මුහම්මද් නබි (සල්) තුමාණන් පැවසූ බව අබූ හුරෙයිරා (රළි) මෙසේ වාර්තා කරයි. "නිසැකවම අල්ලාහ් තආලා මෙසේ පවසා ඇත. 'මගේ සමීප ගැත්තන් සමග හතුරුකම් ඇති කරන්නේ කවරෙක්ද මම ඔහුට විරුද්ධ ව සටන් කරමි. මා විසින් (මිනිසා කෙරෙහි) ප්‍රකාශයට පත් කරන ලද අනිවාර්ය වගකීම් ඉටු කිරීම් තුළින් හැර මගේ ගැත්තන්ට මට සමීපවීමට නොහැක. මම ඔහුට ආදරය කරුණාව දක්වන තුරු ඔහු අනිවර්ය ක්‍රියාවන්ට අමතරව අතිරේක යාච්ඤා (නවාෆිල්) මෙහෙයන් ඉටු කරමින් මට සමීප වෙමින් සිටියි. මම ඔහුට දයාව දැක්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහු ශ්‍රවණය කරන්නේ කුමකින්ද, ඔහු ශ්‍රවණය කරන දෙසවන්, ඔහු බලන්නේ කුමකින්ද ඔහු බලන

නේත්‍රාව, ඔහු යම් කිසිවක් රඳවා ගන්නේ කුමකින්ද එසේ රඳවා ගන්නා සුරත, ඔහු ගමන් කරන්නේ කුමකින්ද ඔහු ගමන් කරන දෙපය (යන සියල්ල) මම වෙමි. ඔහු මගෙන් අයද සිටින සියල්ලක්ම ඔහුට ප්‍රදානය කරමි. ඔහු මගෙන් රැකවරණය පතන්නේ නම් සැබැවින් ම ඔහුට රැකවරණය ලබා දෙමි.” මූලාශ්‍ර සහීහ් බුහාරි.

මෙම හදීසයේ සඳහන් වලී නම් පදයේ අර්ථය සැබෑ විශ්වාසිකයා හෝ අති උතුම් අල්ලාහ්ගේ සමීපතම සේවකයෙකු යන්නයි. විලායා යන පද අල් කුර්ආනයේ විවිධ වාක්‍යයන් හි සඳහන් වේ. මෙම වැකි මගින් අල්ලාහ් මෙම අව්ලියාවරුන්ගේ (ඒක වචනය වලී) තත්ත්වය ගැන සාකච්ඡා කරයි. මෙම හදීසයේ අල්ලාහ් තම ගුණාංගය පිළිබඳ ව සඳහන් කිරීමට පෙර වලී වරයෙකුගේ තත්ත්වය පිළිබඳ ව සඳහන් කරයි. මෙම හදීසයේ ආරම්භයේ “මගේ සමීප ගැත්තන් සමග හතුරුකම් ඇති කරන්නේ කවරෙක්ද මම ඔහුට විරුද්ධ ව සටන් කරමි.” යනුවෙන්ද අවසානයේ “ඔහු මගෙන් අයද සිටින සියල්ලම ඔහුට ප්‍රදානය කරමි. ඔහු මගෙන් රැක වරණය පතන්නේ නම් සැබැවින් ම ඔහුට රැකවරණය ලබා දෙමි.” යනුවෙන් සඳහන් කරයි. මෙම හදීසය මැද කොටසේ තම සමීපතම සේවක යාගේ ගතිගුණ කුමක් දැයි අල්ලාහ් සඳහන් කරයි.

තම සමීපතම සේවකයන් ට අල්ලාහ් ආදරය, කරුණාව දක්වන බව මෙම හදීසයේ සනාථ කරයි. මිනිසාගේ යහපත් ක්‍රියාවන් හි ස්වාභාවික ප්‍රතිඵලය මෙය වේ. අල්ලාහ්ගේ ආදරය හිමි කර ගනු පිණිස මිනිසා කළ යුතු දේ කුමක් දැයි අල්ලාහ් සඳහන් කරයි. එම ක්‍රියාවන් ශ්‍රේණි දෙකකට අයත් බව දැක ගත හැක. පළමුවන ශ්‍රේණිය වාජිබාත් නම් අනිවාර්‍ය සියල්ල ඉටු කිරීම සහ මුහර්රමාත් නම් තහනම් සියල්ලෙන් ඉවත් වීමය. දෙවන ශ්‍රේණියට අයත් පිරිස මේවා සියල්ල අනුගමනය කරන අතර, ඒවාට අමතර ව නවාෆිල් නම් අතිරේක නැමදුම් හා කුසල් ක්‍රියාවන් හි යෙදෙති.

අල්ලාහ්ගේ අව්ලියා (විලායත්) යන සංකල්පය අල් කුර්ආන් හි සූරා යූනුස් වාක්‍ය අංක 62 සිට 64 දක්වා සඳහන් වේ.

“දැන ගනු! සැබැවින් ම අල්ලාහ්ගේ අවුලියාවරුන්- ඔවුන් කෙරෙහි බියක් නැත. ඔවුහු ළතවෙන්නෝද නොවෙති. (ඔවුහු) විශ්වාස කර සිරිත් විරිත් රැක හුන් අය. ඔවුනටය මෙලොව ජීවිතයෙහි ද පරලොවෙහි ද ශුභාරංචිය. අල්ලාහුගේ වචනයෙ හි වෙනස්විමක් නැත. එයමයි අත්‍යුත්කෘෂ්ට භාග්‍යය.”

ඉහත සඳහන් කුර්ආන් වැකි 3 සහ මෙම හදීස ය පදනම් කර ගෙන විලායාත් නම් සංකල්පයට පහත සඳහන් කරුණු අඩංගුය.

1. අල්ලාහ් කෙරෙහි ආදරය;
2. අල්ලාහ් කෙරෙහි බිය;
3. අල්ලාහ් සහ ඔහුගේ නබි (සල්) තුමාණන් කෙරෙහි විශ්වාසය;
4. අල්ලාහ් කෙරෙහි බැතිමත්කම, අවංකකම සහ විශ්වාස වන්තකම;
5. යහ ක්‍රියාවන් ඉටු කිරීම ඇතුළු අල්ලාහ්ගේ අණට අවනතවීම. බිය, පශ්චාත්තාපය සහ අල්ලාහ්ගේ තීරණයට යටත් වීම මත මෙම අවනතවීමේ චේතනාව පදනම් කෙරේ;

මෙයින් ඉගෙන ගන්නා පාඩම්.

හදීසයේ මුල් කොටස දෙස බලමු.

"මා විසින් (මිනිසා කෙරෙහි) ප්‍රකාශයට පත් කරන ලද අනිවාර්යය වගකීම් ඉටු කිරීම් තුළින් හැර මගේ ගැත්තන්ට මට සමීප වීමට නොහැක. මම ඔහුට ආදරය කරුණාව දක්වන තුරු ඔහු අනිවායීය ක්‍රියාවන්ට අමතරව අතිරේක යාච්ඤා (නවාෆිල්) මෙහෙයන් ඉටු කරමින් මට සම්ප වෙමින් සිටියි."
අල්ලාහ් තම ගැත්තන් දෙවර්ගයට වෙන් කරයි.

1. පළමු වන පිරිස අනිවායීය ක්‍රියා ඉටු කරමින් සහ තහනම් දෙයින් ඉවත් වී අල්ලාහ්ට සමීප වන

පිරිස. ඔවුන් කුර්ආනයේ “අස්හාබ් අල් යමීන්” යනුවෙන් සඳහන් කරනු ලැබූ මධ්‍යම තලයට අයත් පිරිසය. එනම් අනිවාර්‍යය කරුණු ඉටු කිරීම සහ තහනමින් ඉවත්වීම විලායාත් හි අවම අවශ්‍යතාව වේ. විලායාත් හි මෙම පියවර සෑම විශ්වාසීන්ගෙන්ම බලාපොරොත්තු වේ.

2. දෙවන පිරිස අල්ලාහ් කෙරෙහි ඉතා බැතිමත් වන අතර තම දෛනික නැමදුමෙ හි හා අල්ලාහ් ට සමීපවීමේ උත්සාහයේ නිරන්තර යෙන් (සාබිකූන්) යෙදී සිටිති. මේ පිරිස අනිවාර්‍ය නැමදුම් ඉටු කිරීමෙන් සහ තහනම් දෙයින් ඉවත් වීමෙන් පමණක් සෑහීමට පත් නොවී, ඒවාට අමතර ව නවාෆිල් නම් අතිරේක නැමදුමෙ හි යෙදීම ද සහ මක්රූහ් නම් අප්‍රිය ක්‍රියාවෙන් පවා ඉවත් ව සිටිති. මේ ක්‍රියා මාර්ගයෙන් ඔවුන් වරා නම් අධික බැතිමත් කම සහ විලායා ලබන හේතුවෙන් අල්ලාහ් ඔවුන් වෙත අධික ලෙස ආදර කරුණාව දක්වයි. මේ බව අල්ලාහ් පැහැදිලි ලෙස ප්‍රකාශ කරයි.මෙහි වැදගත් වන්නේ ඔබ අල්ලාහ්ට ආදරය දැක්වීම නොව අල්ලාහ් ඔබට ආදරය දක්වන්නේද යන ප්‍රශ්නයයි යනුවෙන් ඇතැම් ආරම්භක යුගයේ

සලෆි වරුන් පවසති. මේ අනුව අල්ලාහ් ඔබට ආදරය කරන්නේ නම්, ඔහුගේ කරුණාව, ආශීර්වාදය, සහය සහ යහ මඟ යන දේ ඔබට පිරිනමයි.

නබි (සල්) තුමාණන් මේ ලෙස පැවසීමට පුරුදු වී සිටියහ. "යා අල්ලාහ්! ඔබ මා හට ආදරය දක්වන ලෙසද, ඔබට ආදරය දක්වන අයගේ ආදරය ද පතමි. ඔබට සමීප කරන සෑම ක්‍රියාවක් ම ප්‍රිය කරන්නට මට පහසු කරනු මැනව."

මේ හේතුවෙන් අල්ලාහ් වෙත ආදරය පදනම් කර ගත් යහ ක්‍රියාවන් කරන අය එහි නිරන්තර ව යෙදී සිටින අතර ඔවුන් කිසි විටෙක අධෛර්‍ය වීමට හෝ සිත් කලකිරීමට ලක් වන්නේ නැති බව ආරම්භක යුගයේ ඇතැම් විද්වතුන් පවසති. අල්ලාහ් ව මුණ ගැසෙන බව ස්ථිර විශ්වාසය සහිත බැතිමතුන්, අල්ලාහ් ට සමීප කරන යහ ක්‍රියාවන් ඉටු කිරීමට කිසි විටෙක උදාසීන නොවෙති. අල්ලාහ් ට ආදරය කරන ගැත්තාගේ හදවත පිරිසිදු කරනු ලැබූ එකකි. එම ආදරය උග්‍ර වන ප්‍රමාණයට ඔහුගේ හදවත පිරිසිදු වනු ඇත. අල්ලාහ් ට සමීප කරන යහපත් ක්‍රියාවන් කිරීමට ඔහු නිතර සූදානම් ව ඉදිරිපත් වන්නේ ඉතාමත් සතුටින් ය.

අල්ලාහ් ට ආදරය කරන කෙනෙක් අනිවාර්යයෙන්ම අල්ලාහ්ගේ අණ අනුගමනය කරන බව ආරම්භක යුගයේ විද්වතුන් පවසති. මේ නිසා අධික ලෙස නවාෆිල් නම් අතිරේක නැමදුම් දිනපතා කිරීමෙන් අල්ලාහ් ට සමීප විය හැක.

- නබි (සල්) තුමාණන් දෛනික ව ඉටු කළ නවාෆිල් නැමදුමෙහි නිරත වීම.
- අල් කුර්ආනයේ වාක්‍ය කියවීම, ඒවාට ඕනෑකමින් සවන් දීම සහ ඒවායේ අර්ථය අවබෝධ කර ගැනීම.
- අල්ලාහ්ව සිහි කිරීම, එනම් දිවෙන් පවසන දේ සිත් හි තිබෙන දේ සමඟ සැසඳීම.
- අල්ලාහ් ට සමීප ව සිටින අනිකුත් මුස්ලිම් වරුන් කෙරෙහි ආදරය දැක්වීම.

හදීසයේ "මම ඔහුට දයාව දැක්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහු ශ්‍රවණය කරන්නේ කුමකින්ද, ඔහු ශ්‍රවණය කරන දෙසවන්, ඔහු බලන්නේ කුමකින්ද ඔහු බලන නේත්‍රාව, ඔහු යම් කිසිවක් රඳවා ගන්නේ කුමකින්ද එසේ රඳවා ගන්නා සුරත, ඔහු ගමන් කරන්නේ කුමකින්ද ඔහු ගමන් කරන දෙපය (යන සියල්ල) මම වෙමි." යන දෙවන කොටස පිළිබඳව ඉමාම් ඉබ්නු රජබ් මෙසේ අදහස් දක්වයි.

අනිවාර්‍ය ක්‍රියාවන් සමඟ අතිරේක නැමදුම් කරමින්, ඒ මගින් ගැත්තා එක තත්ත්වයේ සිට ඊට ඉහළ තත්ත්වය ට පත් වීමෙන් ඉහ්සාන් නම් තත්ත්වය ලබා ගන්නා බව මෙම වැදගත් හදීස් වදන සඳහන් කරයි. මෙම තත්ත්වයේ දී ඔහු අල්ලාහ් ව දෑසෙන් දකින්නා සේ නැමදුම් කරන අතර, ඔහුගේ හදවතෙහි අල්ලාහ් කෙරෙහි ආදාරය උතුරා යන මුරාකබා නම් අදියරයට පැමිණෙයි.

මෙම තත්ත්වයේ අල්ලාහ්ගේ කරුණාව ඔහු වෙත පහළ කරමින් තම ගැත්තාට අල්ලාහ්ට නමදින්නට සහ උත්කර්ෂයට පමුණුවන්නට පහසු වනු ඇත. මෙම අවස්ථාවේ අතිරේක නැමදුම් කිරීමට ඔහු පහසු කරන ලදු ව අල්ලාහ්ට පමණක් ඔහුගේ හදවත කැප කරයි. මෙම හදවත අන් කිසිවකගේ බලපෑමට හෝ අත්පත් කර ගැනීමට හෝ වහල් බවට පමුණුවන්නට නොහැකි වේ.

එවැනි හදවත් සහිත කෙනෙකුගේ අවයවන් අල්ලාහ් කැමති දේ පමණක් කරයි. අල්ලාහ් දකින, සවන් දෙන සහ කරන දේ පමණක් මෙම ගැත්තා දකියි, සවන් දෙයි, කරයි. එවැනි කෙනෙකුගෙන් කිසිදු පාපයක් සිදු නොවන බව ඇතැම් (සලෆි) විද්වතුන් පවසති.

තව්හීද් නම් ප්‍රකාශය පවසන අයුරින්, අල්ලාහ් ට පමණක් නැමදුම් කිරීමට, කීර්තිය පවසන්නට,

අවනත වීමට, ආදරය දක්වන්නට සහ බිය වීමට අප බැඳී සිටිමේ ප්‍රතිඵලයෙන් මෙය එකකි. අල්ලාහ් අකැමැති දෙයක් මෙම ගැත්තා ප්‍රිය කළේ නම් හෝ අල්ලාහ් ප්‍රිය කරන දෙයක් මෙම ගැත්තා අකැමැති නම් පමණක් පාපයක් සිදු වනු ඇත. අල්ලාහ් කෙරෙහි ආදරයට ඉහළින් පුද්ගලික වාසියට ප්‍රමුඛ ස්ථානයක් හා ප්‍රධානත්වයක් දෙන විට ද මෙය සිදු විය හැක. එ පමණක් නොව එම පුද්ගලයාගේ තව්හීද් නම් ඍජු විශ්වාසයේ අසම්පූර්ණ භාවයට මේ ක්‍රියාව හේතුවක් වෙයි.

මෙම හදීසයේ තුන් වන කොටස මෙසේ පවසයි.

"ඔහු මගෙන් අයද සිටින සියල්ල ම ඔහුට ප්‍රදානය කරමි. ඔහු මගෙන් රැකවරණය පතන්නේ නම් සැබැවින් ම ඔහුට රැකවරණය ලබා දෙමි."

මෙහි දී අල්ලාහ්ගේ අවුලියා වරුන්ට අල්ලාහ් ඉදිරියෙහි විශේෂ ස්ථානයක් තිබේ. එවැනි කෙනෙකුගේ දුආ සහ ඉල්ලීම් වලට පිළිතුරු දෙනු ලැබේ. ඔහු යම් දෙයකින් රැකවරණය පැතුවේ නම් එය අනිවාර්‍යයෙන් දෙනු ලැබේ.

අන් නසායිගේ සුනන් ග්‍රන්ථයේ ඉස්තිආදා නම් පරිච්ඡේදයේ, නබි (සල්) තුමාණන් රැකවරණය පැතූ සියලු දේ ගැන සඳහන් වී තිබේ. මෙලොවේ දිළිඳුකම, නුගත්කම, සොහොනෙ හි දඬුවම, දුක සහ දොම්නස යන සියලු දැයින් නබි තුමාණන්

රැකවරණය පැතූහ. මේවා පිළිබඳ හදීස් වදන් සියල්ල දුආ ලෙස සඳහන් වේ. මෙම දුආ අල්ලාහ්ගේ ආදරය සහ මෙලොවේ විවිධ හානි වලින් රැකවරණ පතන දුආ ලෙස සඳහන් වී තිබේ.

මෙහි අවසාන වශයෙන් වැදගත් කරුණක් පිළිබඳ ව සඳහන් කළ යුතු ව තිබේ. අවුලියා යනු කවරෙක් ද යන්න නොයෙක් වැරදි මත පවතී. මෙම පුද්ගලයා කවරෙක්ද, ඔහුගේ ගුණාංගයන් කුමක්ද යනුවෙන් පොදුවේ මුස්ලිම්වරුන් අතරේම නොයෙකුත් වැරදි වැටහීම් තිබේ. අද මුස්ලිම්වරුන් වලි කෙනෙකුගේ ගුණාංගයන් පිළිබඳ ව කුර්ආන් සහ හදිස් වදන් පවසන සත්‍යයට ප්‍රතිවිරුද්ධ ව පහදා ගෙන සිටිති. මේවායින් බොහෝමයක් මිත්‍යා කට කථා මගින් පැතිරුණු කරුණු වේ. මේවා කරාමත් ලෙස ද හැඳින් වේ. නුගත් ජනතාව වලි කෙනෙකුගේ විශේෂ හැකියාව පිළිබඳ ව පවසන්නේ මිත්‍යා කරාමාත් මත ය.එම පුද්ගලයා නිතර අල්ලාහ් ට සමීප වීම පිණිස නැමදුමෙ හි නිරත වන කෙනෙක් යන සත්‍යය බොහෝ සේ අමතක වී අවසානය. මේ හේතුවෙන් වලී යන ස්ථානය ට හිමිකම් කියන අය ඉස්ලාමයේ සත්‍ය ඉගැන්වීම් වලට බාහිරව කටයුතු කිරීම අපි දකිමු. මෙම අවුලියාවරු බොහෝ අවස්ථාවන් හි මෙම විශේෂ හැකියවන් උපයෝගි කර ගෙන මිනිසුන්ගේ අවධානය, කීකරුවීම සහ ඇතැම් විට මුදල් පවා රැස් කරන්නට ක්‍රියා කරති.

මෙවැනි හැසිරීම් හි යෙදෙන කෙනෙක් අල්ලාහ්ගේ වලී කෙනෙක් වන්නේ කෙසේද? එනිසා සැබෑ අවුලියා වරයෙක් තම විලායා භාවය ස්වයම් ප්‍රවර්ධනය සඳහා අයුතු ලෙස උපයෝගි නොකරයි. විලායා යනු අල්ලාහ් කෙරෙහි ආදරය හේතුවෙන් ඔහුගේ හදවතෙ හි පවතින සිතුවිල්ලයි.

මුස්ලිම්වරුන් බහුතරයක් විලායා යන ප්‍රශ්නය පිළිබඳ තවමත් අවුල් වී සිටින නිසා මෙම වැරදි මත ගැන පහදා දිය යුතුය. විලායා නොහොත් කරාමා අල්ලාහ් ට ඉතා සමීපව සිටින කිහිප දෙනෙකු ට පමණක් සීමා වන හේතුවෙන්, ඉමාම් ෂාතබි තුමා මෙයට කොන්දේසි කිහිපයක් පනවා ඇත. වලී වරයෙක් අන් අයට වඩා තමා අල්ලාහ් ට ඉතාමත් සමීපව සිටින බව පවසන්නට කුළෑටි වෙයි. මෙය ඉහ්ඃලාස් නම් අවංක භාවයට පටහැණි වන හේතුවෙන්ය.

අවසාන නිගමනය

ඉස්ලාමයේ ප්‍රධාන මූලධර්මය හෝ සංකල්පය පිළිබඳ ව මෙම හදිසය ප්‍රකාශ කරයි. විලායා නම් අල්ලාහ් ට සමිප වීම සහ වලි නම් කෙනෙකුගේ ලක්ෂණය පිළිබඳ ව මෙම හදීසිය පැහැදිලි කරයි.

විශ්වාස කරන සාමාන්‍ය ජනතාවට සහ අල්ලාහ් ට සමීප ව සිටින ගැත්තන් ට සතුරුකම් කරන්නන්ට එරෙහිව සැබැවින්ම කරන යුද්ධ ප්‍රකාශකි මෙම

හදීසය. කිසිවෙකුට හානියක් සිදු නොකරන ලෙසද, අල්ලාහ්ගේ විශ්වාසීන්ට හානි සිදු කර අල්ලාහ්ගේ සතුරන් බවට පත් නොවන ලෙසද සියලු මුස්ලිම්වරුන්ට සහ මුස්ලිම් නොවන පිරිසට දෙන ලද පොදු නිවේදනයක් බව මෙම හදීසය පහදා ගත හැක. මෙලොව ජීවිතයේ සහ මරණයෙන් පසුව ද පවතින තත්ත්වය මෙය වේ. අපට සාධක වන දේ සහ අපට එරෙහි වන දේ පිළිබඳ ව අල්ලාහ් සැබැවින් ම දනී. උතුම් අල්ලාහ්ගේ සැබෑ ගැත්තෙක් කරන ප්‍රාර්ථනාවන් ට ඇතැම් අවස්ථාවන් හි සාධක ප්‍රතිඵල නොලැබීමට මෙය ද හේතුවකි. මෙයට හේතුව ගැත්තන් කරන ප්‍රාර්ථනාවන් නිසා ඔවුන්ට සහ අන් අයට හානියක් සිදු විය හැක. ප්‍රාර්ථනාවක් කරන තැනැත්තා, ඇතැම් අවස්ථාවන් හි එහි ප්‍රතිවිපාකය කුමක්දැයි නොදනී. එනිසා දුආවක් පිළි ගනු නොලැබුවේ නම්, එහි අල්ලාහ්ගේ ආශීර්වාදයක් සහ කරුණාවක් තිබෙන බව අප වටහා ගැනීම බොහෝ වැදගත් ය. සැබැවින්ම දුආ වෙහි ආසිරි මරණයෙන් පසුව අනිවාර්යයෙන්ම තිබේ.

## 39. අතපසු වීම සහ අමතක වීම සඳහා සමාව ඇත

මුහම්මද් නබි (සල්) තුමාණන් වදාළ බව ඉබ්නු අබ්බාස් (රලි) වාර්තා කරයි. “මගේ උම්මත් හෙවත් ජන සමාජය විසින් අතපසු වීම් සහ අමතක වීම් නිසා සිදු කරනු ලබන වැරදි සඳහා ද අල්ලාහ්

තආලා මා වෙනුවෙන් සමාව දෙන්නේය." මූලාශ්‍ර ඉබ්නු මාජා සහ බයිහකී.

මෙහි පසුබිම

මෙම හදීසයේ සඳහන් කරුණු අල් කුර්ආනයේ ද සඳහන් වේ.

*"අපගේ ස්වාමිනි! අප වැරදීමකින් හෝ අමතක විමෙකින් හෝ (සිදුවූ දැය ගැන) අප (වරදකට) හසු නොකරව."* සූරා බකරා වාක්‍ය අංක 286.

"අපගේ ස්වාමිනි! වැරදීමකින් හෝ අමතක වීමකින් අප සිදු කරන පාපයන්ට දඬුවම් නොකරව." යනු මෙහි තවත් අර්ථයවේ.

*"එහි නුඹලා වැරැදීමකින් කළ දැහි නුඹලාට පාපයක් නොමැත. නමුත් නුඹලාගේ හදවත් ඕනෑකමින් සිදු කළ දැහි (නඹලාට පාපයක් ඇත) තවද අල්ලාහ් අභි ක්ෂමාහීලී පරම කරුණාභරිත විය."* සූරා 33:වාක්‍ය 5

*"තම හදවත විශ්වාසයෙන් සැනසුමට පත්ව තිබිය දී (විශ්වාසයෙන්) බැහැර වන මෙන්) බලකරනු ලබන්නන් හැර."* සූරා 16 වාක්‍ය 106

මෙයින් ඉගෙන ගන්නා පාඩම

අතපසුවීමෙන් හෝ අමතකවීමෙන් සමාව දෙනු ලබන නමුත්, එය සඳහා ප්‍රතිවිපාකයක් නොමැති බව නොසතන්න. කෙනෙකුට සමාන දෙන ලබන

නමත් තම ක්‍රියාවට ඔහු වග කිව යුතුය. මේවා කොටස් තුනකට අයත් වේ.

1. කෙනෙක් වැරදීමකින් කළ ක්‍රියාව නිසා ප්‍රතිවිපාකයක් නොමැති අවස්ථාව දෙස බලමු. රමදාන් මාසයේ මුස්ලිම් වරයෙක් අමතක වීමේ හේතුවෙන් ප්‍රසිද්ධියේ ආහාර ගන්නා මුස්ලිම් වරයෙක්. එම පුද්ගලයාගේ උපවාසය තවමත් වලංගු බවද ඔහු වෙනත් දිනක උපවාසයේ යෙදීමට අවශ්‍ය නැති බව ආගමික විද්වතුන් බහුතරයක් අදහස් දක්වති. "අමතකවීම මේතුවන් රමදාන් මාසයේ ආහාර ගන්නා මුස්ලිම් වරයෙක් සමාව දෙනු ලබයි." යනුවෙන් අල් බුහාරි සහ මුස්ලිම් වාර්තා කළ හදීස් වදන පදනම් කරගෙන මෙම විද්වතුන් තම අදහස් ප්‍රකාශ කරති.

2. කෙනෙක් අමතකවීමකින් හෝ වැරදීතමකින් කළ පාපය නිසා ප්‍රතිවිපාකයක් තිබෙන අවස්ථාවක්. නිදසුනක් වශයෙන් වාහන අනතුරකින් හෝ වැඩ පොළෙහි අනතුරකින් මුස්ලිම් වරයෙක් මරණයට පත්වීම. මෙම වරදකරුට කෆ්ෆාරා නම් පාපමෝචනය සඳහා දඬුවමක් පවරනු නොලබන නමුත් කුර්ආන්

පවසන ආකාරයට ඔහු ෆිද්යා නම් දඩ මුදල ගෙවිය යුතුය. තවත් උදාහරණයක් ලෙස කෙනෙකුගේ ඉඩම් හෝ දේපොළට වැරදීමකින් අලාභයක් සිදු කළ කෙනෙක් දෙස බලමු. තමා විසින් සිදු කරනු ලැබූ අලාභය සඳහා වග කිව යුතුය. ඔහු වන්දියක් ගෙවිය යුතු අතර, අල්ලාහ්ගේ සමාව ඔහුට හිමි වෙයි. ඔහුගේ වරද පාපයක් ලෙස සදහන් නොවනු ඇත.

3. තුන්වන නිදසුන පිළිබඳව ආගමික විද්වතුන් අතර මත භේදයක් තිබේ. එනම්, සලාතයේ නිරත වූ කෙනෙක් අමතක වීමෙන් කථා කළේ නම් ඔහුගේ නැමදුම යළි ඉටු කළ යුතුද? ඇතැම් විද්වතුන් ඔව් යනුවෙන් ද තවත් තවත් පිරිසන් නැත යනුවෙන්ද මත දරති.

මුස්ලිම් වරයෙක් යම් කටයුත්තක් නොකරන බවට අල්ලාහ්ගේ නාමයෙන් දිවුරන නමුත් අමතක වීමෙන් හෝ වැරදීමකින් ඔහු එය සිදුකරයි. ඔහු එම ක්‍රියාවට වගකිව යුතු බවද, සමාව දොනු නොලබන බවද, කෆ්ෆාරා නම් පාපමෝචනය සිදු කළ යුතු බවද ඇතැම් විද්වතුන් දන්වති. තවත් පිරිසක්. ඔහු සමාන දෙනු ලබන බවද, කෆ්ෆාරි සිදු කිරීමට අවශ්‍ය නැති බවද අදහස් දක්වති. මෙහි තවත් නිදසුනක්

දෙස බලමු. උම්රා හෝ හජ් කර්තව්‍ය ඉටු කිරීම සඳහා ඉහ්රාම් තත්ත්වයට ඇතුළු වූ කෙනෙක් දඩයමේ යෙදීම තහනම්. එවැනි කෙනෙක් අමතකවීමෙන් සතෙක් දඩයම් කළේ නම්, ඔහුට සමාව දෙනු ලැබේ ද? මෙය පාප ක්‍රියාවක් ලෙස සැළකේද? මෙම ප්‍රශ්නය විද්වතුන් අතර සංවාදයට මග පාදයි. ඔහුට සමාව දෙනු ලැබිය හැකි නමුත්, ඔහුට දඩයක් පැනවිය යුතු ද? පාප ක්‍රියාවන් යනු සිතා මතා, ඕනෑකමින් සිදු කරන ක්‍රියාවක් බව ඉමාම් ඉබ්නු රජබ් පවසයි. එනිසා, අමතවිමෙන් හෝ වැරදීමකින් එය ඉටු කළ මේ මිනිසා සමාව දෙනු ලබයි. මෙම හදීසය පවසන්නේ කෙනෙකුගේ වගකීම පිළිබඳ නොවේ. වරද සිදු කළ මුස්ලිම්වරු තමා සම්පූර්ණයෙන් නිදහස් ලබන බවද, එහි විපාකය සඳහා තමා වග කිව නොයුතු බවද මුස්ලිම්වරු බොහෝ දෙනෙක් වරදවා සිතා ගනිති.

ඉස්ලාම් අනුමත නොකළ කටයුත්තක් ඉටු කරන ලෙස බලකිරීමට කෙනෙක් ලක්විය හැකි බව ඉබ්නු රජබ් පවසයි. ඉක්රාහ් (සංත්‍රාසනය) යනු හැඳින් වනු ලබන මෙය වර්ග දෙකකට අයත් ය.

1. දුබලකම හේතුවෙන් බල කිරිමට එරෙහිවීමට නොහැකි කෙනෙක් පාපයක් හෝ ෂරීආ අනුමත නොකළ ක්‍රියාවක් කළහොත්, ඔහුට සමාව ලැබෙයි.

2. කෙනෙකුට හානියක් සිදුකරන ලෙස බලපෑමට ලක් කරනු ලබන කෙනෙක්. මෙවැනි බලපෑමෙන් මිදීමට කෙනෙකුට හැකියාවක් තිබේද යන ප්‍රශ්නයකි. කෙසේ වෙතත් මෙම අවස්ථාවෙහි තවත් කෙනෙකුට හානිය සිදු කරමින් හෝ තමාට සිදුවන හානියෙන් මිදීම ඔහුගේ අරමුණවේ. මෙහිදී විද්වතුන්ගේ නිගමනය කුමක් ද? තමාට හානියක් සිදුවන බව දැන සිටියත් මුස්ලිම්වරයෙක් ඇතැම් (අන් අයට හානි සිදු කිරීම වැනි) ක්‍රියාවන් හි යෙදිය නොයුතු යැයි විද්වතුන් නිගමනය කරති. උදාහරණයක් වශයෙන් ඔහු තව කෙනෙකු ඝාතනය කරන ලෙස බලපෑමට ලක්වෙයි. මිනිස් ඝාතන මහා පාපයක් ලෙස ඉස්ලාම් පවසන හේතුවෙන් මුස්ලිම් වරයෙක් එය නොකළ යුතුය.

මෙම හදිසයේ සඳහන් කරුණු වලින් කිසිවෙක් අනිසි ලෙස උපයෝගි කළ නොහැක. තමා දුන් පොරොන්දුව කඩ කිරීමට හෝ වගකීම පැහැර හැරීමට ඇතැම් මුස්ලිම්වරු ක්‍රියා කරති. අල්ලාහ් අපගේ අරමුණ කුමක් දැයි දන්නා හෙයින් මේ පිළිබඳව ප්‍රෙව්සම් විය යුතුය.

අවසාන නිගමනය

ඉහ්සාන්, ගුණත්වය, ක්‍රියාවෙහි උතුම් භාවය, වගකීම භාර ගැනීමේ හැකියාව වැනි ඉස්ලාම් අගය කරයි. සාහසික, අපරීක්ෂාකාරි, හා අනවධානය වැනි ගුණාංගයට ඉස්ලාම් රුකුල් නොදෙයි. මිනිසා ගේ ස්වාභාවික සීමාවන් ගැන ඉස්ලාම් දනී. සිදු වූ වරදින් හා අත් දැකීනෝ පාඩමක් ඉගෙන ගන්නා ලෙස ඉස්ලාම් අනුබල දෙයි. මුස්ලිම් වරයෙක් එකම ස්ථානයෙන් දෙවරක් දෂ්ට කිරීමට ලක්විය නො යුතුය යි මුහම්මද් (සල්) තුමාණන් අවවාද කළහ.

අපේ ක්‍රියාවන්ට අප වග කිව යුතු බව මෙම හදීසය තහවුරු කරයි. මිනිසා විසින් වැරදි සිදු කළ හැකි නිසා, ඒවා සඳහා මාර්ග සලසා තිබෙන නමුත් වගකීමෙන් අපට බැහැරවිය නොහැක.

## 40. මෙලොව ජීවිතය කෙරෙහි මුස්ලිම්වරයෙකුගේ ආකල්පය

ඉබ්නු උමර් (රලි) වර්තා කරන හදීසයක මෙසේ සඳහන් වේ. මුහම්මද් නබි (සල්) තුමාණන් මගේ උරහිසට සිය දෑත තබා මෙසේ අවවාද කළහ. “ඔබ මෙලොව දිවි ගෙවන පරදේශකයෙකු වශයෙන් හෝ මගතොටෙහි කල දවස ගතකරන්නෙකු වශයෙන් ජීවත්වන්න.”

ඉබ්නු උමර් (රලි) මෙසේ පවසයි. “හිරු බැස යාමෙන් පසු (හිරු උදා වන තුරු ජීවතුන් අතර සිටිම්

යැයි සිතා) හෙට දවස ගැන අපේක්ෂාවෙන් නොසිටින්න. හිරු උදාවීමෙන් පසු (හිරු බැස යන තුරු ජීවතුන් අතර සිටිමි යැයි සිතා) සැන්දෑ වරුව ගැන අපේක්ෂා වෙන් නොසිටින්න. ඔබ රෝගාතුරු වීමට පෙර නිරෝගීව සිටින විට දී කුසල් කර්මයන් හි යෙදෙන්න. මරණයට පෙර ජීවතුන් අතර සිටින විට දී යහකම් කරන්න." මූලාශ්‍ර බුහාරි.

පසුබිම

මෙලොව ජීවිතය හා මරණයෙන් මතු ජීවිතය පිළිබඳ ව සඳහන් කරන අල් කුර්ආන් වැකි බොහෝමයක් ඇත. මෙම වාක්‍යයන් හි මරණයෙන් මතු ජීවිතය සැබෑවක් බව විශේෂයෙන් පවසන අතර මෙලොව ජීවිතය විනෝදය මිස අන් කිසිවක් නැති බව අල්ලාහ් මෙසේ පවසයි.

*"මෙලොව ජීවිතය කෙළියක්ද අනථයක්ද මිස නැත. එසේ හෙයින් භක්තිවන්තයන්ට අවසන් දින ඉතා හොඳය.ඔබ වටහා නොගන්නෙහුද?* "සූරා අල් අනාම් 6:32.

එවැනි කරුණක් ගැන සූරා අන්කබූත් වැක්‍ය අංක 64 අල්ලාහ් මෙසේ පවසයි.

සූරා මුහම්මද් වාක්‍ය අංක 36, සූරා යූනුස් වාක්‍ය අංක26, සූරා කහ්ෆ් වාක්‍ය අංක 45,46 සූරා ෆාතිර් වාක්‍ය අංක 5, සූරා අල් අ'අලා වාක්‍ය අංක 16 හ 17, සූරා අල් ඉස්රා වාක්‍ය අංක18-19.

මේ සියලු වාක්‍යයන් හි මරණයෙන් පසු ජීවිතය ට විශ්වාසීන්ගේ අවධානය යොමු කර, අවසාන නවාතැන එය බව ද සැබෑ ජීවිතය සහ සතුට එහි තිබෙන බව ද අල්ලාහ් පවසයි. මෙලොව ජීවිතය පරීක්ෂණ හා කරදර සහිත එකක් වන අතර, මතු ජීවිතයට ගෙන යන මාර්ගයක් පමණි.

ජීවිතයෙ හි සංතුලනය තාව අනුගන්මනය කරන ලෙස ඉස්ලාම් අපට උගන්වයි. මෙලොව ජීවිතය මතු ජීවිතය සඳහා සම්පූර්ණයෙන් ම කැප කරන ලෙස අල්ලාහ් නොපවසයි. ඉස්ලාමයේ කිසිදු “රහ්බාන” නම් අන්තවාදය හෝ මෙලොව ජීවිතය හා මතු ජීවිතය අතර කිසිදු ගැටලුවක් ඇති නොකරයි. මතු ජීවිතය සෙවීමේ දී මධ්‍යස්ථභාවය අපගේ සියලු කටයුතු වල තිබිය යුතුය. අල්ලාහ් හෙළි දරව් කළ දහමට එකඟ ව ඒක දේව වාදය සහ යහපත් ගුණාංගයන් පදනම් කර ගත් සමාජයක් ගොඩ නැගීම සෑම විශ්වාසීන්ගේම වගකීමකි.

අල්ලාහ් ට පමණක් නැමදුම් කිරීම යන උබූදිය්යා නම් සංකල්පයට එකඟ ව ජිවිතයෙ හි සියලු දේම සිදු විය යුතුය. අල්ලාහ්ගෙන් පහළ වූ දහම සහ යහපත් අරමුණ මෙයට මග පෙන්වයි. ඕනෑම ක්‍රියාවක් ෂරීආවට එකඟ ව සිදු කරන්නේ නම්, මොලොව ජීවිතය මතු ජීවිතය හා සම ව පවතී. එනිසා මුස්ලිම් වරයෙකුගේ මෙලොව හා මතු ලොව ජීවිතය අල්ලාහ්ගේ අණට කීකරු වීම විය යුතුය.

මේ සඳහා යහපත් ජීවිතයක් ස්ථාපිත කර, අල්ලාහ්ගේ අණට එකඟ ව ජීවත් වීම සමඟ මතු ලොව ඉලක්ක කර ගත යුතුය. මෙවැනි කෙනෙක් මෙලොවෙ හි සතුට ලබන අතර අල්ලාහ්ගේ තිළිණය ද හිමි කර ගනී.

මෙයින් ඉගෙන ගන්නා පාඩම්

මුහම්මද් නබි (සල්) තුමාණන් යමක් පවසන විට, එයට සවන් දෙන්නාගේ අවධානය තමා වෙතට යොමු කර ගනු පිණිස නොයෙක් උපක්‍රම යෙදූහ. මෙලොව ජීවිතයේ කරුණු පිළිබඳ ව උපදෙස් දෙන විට, සවන් දෙන්නා අනුගමනය කිරීම පිණිස විකල්ප මාර්ග කිහිපයක් ඉදිරිපත් කළහ. මෙම හදීසයේ දී මෙලොවෙ හි ජීවත් වීම පිණිස විකල්ප මාර්ග දෙකක් ඉදිරිපත් කළහ.

1. පරදේශකයෙකු ලෙස සිටීම.

මෙය පහසු ක්‍රමයකි. පරදේශකයෙක් ඕනෑම අවස්ථාවක තම වාසස්ථානය අත හැර දමා තම මුල් නිවසට යන්නට සූදානම් ව සිටියි. ඔහුගේ හදවත ඔහුගේ මුල් ස්ථානයට හෝ උපන් ගමට හැරී යන්නට ආශා කරයි. ඔහුගේ හදවතෙ හි නිතර පවතින්නේ උපන් ගම කෙරෙහි ආශාවයි. මෙම පරදේශිකයා තම වර්තමාන පරිසරයේ අය හා සමාන කෙනෙක් නොවේ. එලෙසම දේව විශ්වාසය

සහිත කෙනෙක්, ලෞකික ජීවිතයට පමණක් ඇල්ම දක්වන මිනිසුන් මෙන් නොසිටිය යුතුය. ලෞකික සම්පත් වලට ආශා කර, ආධ්‍යාත්මික පැත්ත සහ මතු ජීවිතය පිළිබඳ සිතුවිලි ඉවත දමන බොහෝ අය මෙන් ඔහු ජීවත් නොවිය යුතුය. ලෞකික ජනයා මෙන් නොව විශ්වාසවන්තයෙකු වශයෙන් ඔහු වෙනත් මාර්ගයක් අනුගමනය කළ යුතුය.

මුස්ලිම් වරයෙක් විශ්වාසය නොමැති අය අතර පරදේශකයෙකු වෙයි, මූඃමින් වරයෙක් මුස්ලිම්වරු අතර පරදේශිකයෙකු වෙයි. මුහ්සින් වරයෙක් මුඃමින් වරු අතර පරදේශිකයෙකු වෙයි යනුවෙන් ෂෙය්ක් ඉබ්නු අල් කය්යිම් (රහි) පැවසුහ. එනම්, පරදේශිකයන් අතර විවිධ තරාතිරම් තිබේ. එහි අවම මට්ටම ඉස්ලාම්, දෙවන මට්ටම ඊමාන්, තුන් වන මට්ටම ඉහ්සාන් ලෙස පිහිටයි.

2. මගියෙකු ලෙස හෝ එක්තරා මාර්ගයක ගමන් ගන්නා සංචාරකයෙකු ලෙස හෝ සිටීම.

මෙය ඊට වඩා ඉහළ තත්ත්වයකි. මගියෙක් රෑ දහවල් නොතකා නොනැවති ගමනේ යෙදෙ යි. ඔහු ඇදෙන්නේ තම අවසාන නවා තැන දෙසට යි. ඔහු යම් අවස්ථාවක නවා තැනක් ගත්ත ද, එය තම දීර්ඝ ගමනට අත්‍යවශ්‍ය දේ ලබා ගෙන තම ප්‍රධාන අරමුණ කරා යෑමටයි. පරදේශකයෙක් තම අවශ්‍යතාවට අමතර ව බොහෝ දේ රැස් කරන

නමුත්, මගියෙක් තම අත්‍යවශ්‍ය දෑ අවම ප්‍රමාණයක් පමණක් රැගෙන යයි. ඒ ආකාරයෙන් ම සැබෑ දේව විශ්වාසිකයෙක් තම අරමුණ කරා යන ගමනේ අත්‍යවශ්‍ය දේ පමණක් රැගෙන යන අතර, අනවශ්‍ය ලෞකික සම්පත් වල බර උසුලන්නට සූදානම් නොවිය යුතුය.

මගියෙක් තමා නිවැරදි මාර්ගයේ ගමන් කරන බව ස්ථිර ව දැන සිටිය යුතුය. මේ සඳහා අවශ්‍ය දැනුම ඔහු ලැබිය යුතුය. ඔහු යන මාර්ගයේ සහය වන විශ්වාසවන්ත, යහ මිතුරන් ද සිටිය යුතුය.

මෙලෙස ගමන් කරන මගියා තම ජීවිතය අවසාන ඉලක්කය කරා යන බව මරණය සිදු වන විට සැහීමට පත් වන්නේ කෙසේදැයි ඇතැම් විද්වතුන් විමසති. කෙනෙක් ඒ මොහොත දක්වා තම ජීවින ගමන දෙස හැරී බලන්නේ නම්, එය ඇස් පිය හෙළීම මෙන් සුළු මොහොතක් බව දකින බව විද්වතෙක් පවසයි. මෙම දැනුම මගින් තම සැබෑ තත්ත්වය ගැන අවබෝධ කර ගැනීමට සහ යළි නිවැරදි මාර්ගය කරා ගමන් කිරීමට අවශ්‍ය පියවර ගන්නට කෙනෙකුට හැකි වනු ඇත.

ඉබ්නු උමර් (රළි) තුමාට නබි (සල්) තුමා පැවසූ දෙවන හදීසය මෙම පළමු වන හදීසය පැහැදිලි කරයි. “හිරු බැස යාමෙන් පසු (හිරු උදා වන තුරු ජිවතුන් අතර සිටිම් යැයි සිතා) හෙට දවස ගැන

අපේක්ෂාවෙන් නොසිටින්න. හිරු උදාවීමෙන් පසු (හිරා බැස යන තුරු ජීවතුන් අතර සිටිමි යැයි සිතා) සැන්දෑ වරුව ගැන අපේක්ෂා වෙන් නොසිටින්න.” යනුවෙන් උමර් (රළි) වාර්තා කරයි.

මෙම හදීසය පහදා ගන්නට තවත් නොහැකි නම්, ඉබ්නු උමර් (රලි) පවසන ඉතිරි කොටස දෙස බලන්න. “ඔබ අසනීප වීමට පෙර නිරෝගීව සිටින විට දී කුසල් කර්මයන් හි යෙදෙන්න. මරණයට පෙර ජීවතුන් අතර සිටින විට දී යහකම් කරන්න.” මෙහි අර්ථය වන්නේ, අද අපි මනා සෞඛ්‍ය තත්ත්වයේ සිටින නමුත්, අනාගතයේ කුමක් සිදු වෙයි ද යනුවෙන් අපි නොදනිමු. එනිසා අසනීපයට පෙර හෝ මරණය ට පෙර කුසල් ක්‍රියාවන් ඉටු කර, උත්තරීතර අල්ලාහ් ට සමීප වීම ඥානවන්ත හා උචිත ක්‍රියාවකි. නබි (සල්) තුමාණන් අනිත් හදිසයන් හි අපගේ කාලය මෙලොව සහ මතු ලොව ට යහපතක් ගෙන දෙන ක්‍රියාවන් සඳහා මිඩංගු කළ යුතු බව අවධාරණය කර ඇත.

මුස්ලිම්වරුන්ගේ ජීවිතයන් හි මෙම හදිසය සිදු කරන බලපෑම්:

මෙම හදීසය හොඳාකාරව අවබෝධ කර ගැනීමෙන් අපගේ දෛනික ජීවිතයේ එය වෙනසක් සිදු කරන්නේ කෙසේ දැයි වටහා ගත හැකි වෙයි.

1. අල්ලාහ් කෙරෙහි, ඥාතීන් හා සමාජය කෙරෙහි අපේ වගකීම පිළිබඳ ව වැඩි අවබෝධයක් සිදු කරයි.

2. කුසල් ඉටු කිරීමට ද, අකුසලින් වලකින්නට ද අපගේ සිත් පොලඹවයි.

3. සැම අවස්ථාවකම අල්ලාහ් ට සමීප ව සිටීමට පොලඹවනු ලබයි.

4. දුබලකම්, අඩුලුහුඩු කම් සහ පාපතර ක්‍රියාවන් අවම කිරීමට හා ඒවායින් වැළකී සිටීමට පොලඹවනු ලබයි.

5. තම ක්‍රියාවන් සඳහා වගකීම් භාර ගැනීමට හා ස්වයං නිරීක්ෂණය කිරීමට රුකුල් දෙයි.

6. අල්ලාහ් කෙරෙහි බැතිමත් භාවය ගැන අවධාරණය කරයි.

7. ආත්මාර්ථකාමී වීමෙන් හා ලෞකික ආශාවන්ට ගොදුරු වීමෙන් ආරක්ෂාව ලබන්නේ කෙසේ දැයි අපට උගන්වයි.

අභියෝගයන්:

මෙම හදීසය සඳහන් කරන ස්ථානයට ළඟා වීමේ මාර්ගයේ තිබෙන අභියෝගයන් පිළිබඳ ව ද අපි

අවබෝධ කර ගත යුතුය. මෙම බාධක ගැන අවබෝධ කර ගෙන එවායෙන් ආරක්‍ෂා විය යුතුය.

1. ලෞකික සතුට කෙරෙහි සිත් පොලඹ වීම, විශේෂයෙන් නවීන මාධ්‍යයන් මාර්ගයෙන් මෙය සිදු වේ.

2. අප ස්වභාවික ව අගය කරන දේ සහ නවීන දේ අතර ගැටුම්.

3. තාක්ෂණ වර්ධනය හේතුවෙන් ජීවන රටාවේ සිදු වන ශීඝ්‍ර වෙනස්කම් සහ ඒවායින් පැන නගින ප්‍රශ්න.
   a. පැරණි හා නවීන ජීවන ක්‍රමය අතර ගැළපීමේ ප්‍රශ්නය.
   b. අප ස්වභාවික ව අගය කරන දේ සහ නවීන දේ අතර ගැටුම්.
4. නව්‍යකරණයේ අභියෝග.
5. ගෝලීයකරණය සහ අසභ්‍ය බටහිර ජීවන ක්‍රමයේ අභියෝගය.

අවසාන නිගමනය

හදීස් වදන් අනුගමනය කිරීමට උත්සාහ දරන විට ඉහත සඳහන් අභියෝග සියල්ල මුස්ලිම් වරයෙකුට උසුලන්නට සිදු වේ. මෙම හදිසය නිසියාකාර ව තම ජීවිතයේ මුස්ලිම්වරයෙක් අනුගමනය කළේ නම්,

කරුණු දෙකකින් ඔහුගේ ජීවිතය සාර්ථක කර ගත හැකි වෙයි. එ නම්, අප මුහුණ දෙන සියලු ප්‍රශ්න අවබෝධ කර ගැනීම සහ මෙම හදීසය අනුගමනය කිරීම ජීවිතය සාර්ථක කර ගැනීම යනුවේ.
ඇතැම් මුස්ලිම්වරු මෙම හදීස් වදන වරදවා පහදා ගත් හේතුවෙන් ජීවිතය ගැන ඉස්ලාමීය ඉගැන්වීම් වැරදි ලෙස අවබෝධ කර ගත්හ. නවායකරණයේ අභියෝග නිසා ඔවුන් ලෞකික ජීවිතයට අධික ලෙස අවධානය යොමු කළහ. තාක්ෂණයේ ගිලිහී ගිය ඔවුන් ජීවිතයේ දුබල ඊමානය සහ අවම යහ ක්‍රියාවන් සමග ගමන අවසන් කළහ. මෙහි දී මෙලොව හා මතු ලොව අතර ගැටුමක් හෝ ප්‍රතිවාදයක් ඉස්ලාමීය සංකල්පයේ නැති බව කවුරුත් අවබෝධ කර ගත යුතුය. මුස්ලිම්වරයෙක් මෙලොව ජීවත් වන අතර, ඔහුගේ සිත උත්තරීතර අල්ලාහ් සහ මතු ජීවිත කෙරෙහි කැප වී තිබේ. ඔහුගේ ඕනෑම කටයුත්තක් අල්ලාහ් ව සතුටු කරන අරමුණින්, ඉස්ලාමීය ඉගැන්වීම සහ අල්ලාහ්ගෙන් පහළ වූ යහමඟ ට එකඟ ව සිදු කෙරේ.

## 41. ඊමාන් නම් විශ්වාසයේ සංකේතය

මුහම්මද් නබි (සල්) තුමාණන් පැවසූ බව අබූ මුහම්මද් අබ්දුල්ලාහ් ඉබ්නු අම්රු ඉබ්නු අල් ආස් (රළි) මෙසේ වාර්තා කරයි. "මා රැගෙන ආ දහම පිළිපැදීම කෙරෙහි ඔබගේ අභිමතය ඇති වන තුරු

ඔබ අතුරින් කිසිවෙකු (මූමින්) විශ්වාස වන්තයෙකු බවට පත්වන්නේ නැත." මූලාශ්‍ර කිතාබුල් හුජ්ජා ග්‍රන්ථයේ අල් මක්දසි.

මෙහි පසුබිම

මෙම හදිසය සත්‍යවත් පුද්ගලයින් විසින් වාර්තා කරනු ලැබූ බව ඉමාම් අන් නවවි (රහි) තුමා පවසයි. මෙම හදීස් වදනෙ හි අර්ථය අල් කුර්ආන් සූරා අන් නිසා වාක්‍ය 65 අවධාරණයෙන් යුතු ව කියයි.

*"නුඹගේ ස්වාමිහුගේ නාමයෙන්, ඔවුන් අතර විතර්ක වූ දැයෙ හි ඔවුහු ඔබ විනිශ්චයට පත් කර ඔබගේ තීරණයෙහි ඔවුන්ගේ සිත් තුළ අමනාපයක් නොදැක සම්පූර්ණයෙන්ම යටත් වන තෙක් විශ්වාස කරන්නෝ නොවෙති."*

සූරා අල් අහ්සාබ් වාක්‍ය 36 උත්තරීතර අල්ලාහ් මෙසේ පවසයි.

*"අල්ලාහ් ද ඔහුගේ රසූල්වරයා ද යම් කරුණක් තීන්දු කළේ නම් ඔවුන් ගේ (එම) කරුණෙහි විශ්වාස වන්තයින්ට හා විශ්වාස වන්තියන්ට (වෙනත්) ස්වතීන්දුවක් ගැනීම (ට අයිතියක්)නොමැත. කවරෙකු අල්ලාහ්ට ද ඔහුගේ රසූල්වරයාට ද පිටු පාන්නේ ද සැබැවින් ම ඔහු පැහැදිලි මංමුළාවක වන්නෝය."*

මේවා ට එකඟ ව මෙම හදිසය විශ්වාසවන්ත එකක් බව පිළි ගනු පිණිස අවශ්‍ය සාක්ෂි තිබෙන බව ෂෙය්ක් ජමාල් අද් දීන් Zසරබෝ'Zසෝ තුමා පෙන්වා දෙයි. මෙම හදීසයේ ප්‍රධාන තේමාව, නබි (සල්) තුමාණන්ගේ අණට කීකරු ව කටයුතු කරන තුරු, විශ්වාස වන්තයෙක් ඊමාන් හි අත්‍යවශ්‍ය මට්ටම ඉටු කර නැත යන්නයි. එනම්, නබි (සල්) තුමාණන් අණ කළ දේ ඔහු ප්‍රිය කරන අතර, නබි (සල්) තුමාණන් තහනම් කළ දේ ඔහු ද අප්‍රිය කරයි.

මෙයින් ඉගෙන ගන්නා පාඩම්:

අල්ලාහ් කැමති දේ වලට කැමති වීමට සහ අල්ලාහ් පිළිකුල් කරන දේ කෙරෙහි පිළිකුල් කිරීමට සෑම මුස්ලිම් වරයෙකුම බැඳී සිටී. අල්ලාහ් වඩා කැමති දේ කෙරෙහි දාසයා ද කැමැත්ත වර්ධන කළේ නම්, එය අමතර මට්ටමක් ලෙස සැලකේ. එමෙන් ම අල්ලාහ් පිළිකුල් කරන දේ කෙරෙහි දාසයා ද පිළිකුල දැක්විය යුතුය. එනම් එවැනි කරුණු වලින් දාසයා සම්පූර්ණයෙන් වැළකී සිටිය යුතුය. මෙ මගින් අල්ලාහ්ගේ දායාදයට ඔහු හිමිකම් ලබයි.

සහීහ් බුහාරි සහ සහීහ් මුස්ලිම් හි වාර්තා කළ හදීසයක, "ඔහු, ඔහුගේ දරුවන්, ඔහුගේ පවුලේ අය, සියලු මිනිසුන් ට වඩා මම ඔහුට ප්‍රිය කෙනෙක් බවට පත්වන තුරු, කෙනෙක් සැබෑ විශ්වාසික යෙක් බවට පත් නොවේ." යනුවෙන් නබි (සල්)

තුමාණන් පැවසුහ. සැබෑ ආදරය සඳහා අල්ලාහ් සහ ඔහුගේ නබි (සල්) තුමාණන් අණ කළ දේ අනුගමනය කිරීම අවශ්‍ය වේ.

*“ඔබ අල්ලාහු ප්‍රිය කරන්නහු නම් මා අනුගමනය කරවු; අල්ලාහු ඔබ ප්‍රිය කරන්නේය. ඔබගේ පාපයන් ඔබට ක්ෂමා කරන්නේය. අල්ලාහු ක්ෂමා ව දෙන්නේය. දයාලු යැයි කියව.*

*අල්ලාහුට ද රසූල් වරයාට ද කීකරු වවු. ඔවුහු (එයට කීකරු නොවී) වැළකුණේ නම්, ඇත්තෙන් ම අල්ලාහ් පිළිකෙව් කරන්නන් ප්‍රිය නොකරන්නේයැයි කියව.”* සූරා ආල ඉම්රාන් වැකි 31,32.

සැබෑ විශ්වාස වන්තයෙකු:

- අල්ලාහ් සහ නබි (සල්) තුමාණන් ට අවංක ව හා මුළු හදවතින්ම ආදරය කරයි:
- අල්ලාහ් සහ නබි (සල්) තුමාණන් ප්‍රිය කරන දේ ප්‍රිය කරයි:
- අල්ලාහ් සහ නබි (සල්) තුමාණන් පිළිකුල් කරන දේ පිළිකුල් කරයි.

මෙවැනි ආදරය පදනම් කර ගෙන ඔහුගේ සියලු කටයුතු සිදු වෙයි. යමෙක් අල්ලාහ් සහ නබි (සල්) තුමාණන් කැමති හෝ අකැමති දේවල ට පටහැණිව ක්‍රියා කළේ නම්, ඔහු තම හැකියාව ට එකඟ ව

අත්‍යවශ්‍ය ක්‍රියා ඉටු කිරීම තුළින් අල්ලාහ් ට සහ නබි(සල්) තුමාණන්ගේ ආදරය ලබා ගැනීමට උත්සාහ දැරිය යුතුය.

අකීකරුවීම සහ පාපයන් සිදු වන්නේ කෙනෙක් අල්ලාහ්ගේ අණට ඉහළින් තම පුද්ගලික ආශාවන් ට ප්‍රමුඛ ස්ථානය දිමෙන් බව අල් කුර්ආන් පෙන්වා දෙයි.

*"ඔවුන් නුඹට පිළිතුරු නොදුන්නේ නම්, එවිට ඔවුන් පිළිපදිනුයේ ඔවුන්ගේ ආශාවන් යැයි නුඹ දැන ගනිවු. අල්ලාහ්ගෙන් වූ යහමගින් තොර තම ආශාව පිළිපදින්නන් ට වඩා නොමඟ වූවෝ කවරහු ද? සැබැවින් ම අල්ලාහ් අපරාධකාර පිරිසට යහමඟ නොපෙන්වන්නේය."* සූරා කසස් 28 වාක්‍ය 50.

*"තවද, ඔබේ සිතුවිල්ල අනුගමනය නොකරවු. එසේ කළහොත් එය නුඹ අල්ලාහුගේ මාර්ගයෙන් නොමඟ යවයි."* සූරා සාද් 38 :26.

අල්ලාහ්ගේ දාසයා ස්වර්ගයට පිවිසීමට පෙර තෘෂ්ණාව දමනය කිරීම අත්‍යවශ්‍යයෙන් සිදු විය යුතු බව අල්ලාහ් දන්වයි.

*"එහෙත් තම හිමි සන්නිධානයෙහි (අන්තිම දින) ඉදිරිපත් වීම ගැන බිය වී (මෙලොව) පහත් ආශාවෙන් වැළකුණු අය නම්. ජන්නා වෙහි ඔහු නිවසන තැන"* සූරා අන් නාසියාත් 79:40,41

අල්ලාහ්ගේ රසූල් (සල්) තුමාණන් ගෙන ආ නිවේදනයට පටහැණිව ක්‍රියා කර අල්ලාහ්ගේ අණ සහ තහනම කඩ කරන ඕනෑම මුස්ලිම් වරයෙක්, තම ආශාවන් අනුගමනය කරන බව සලකනු ලැබේ. නිවේදනයට පටහැනි ව මෙම වැරදි ක්‍රියාවන් හි කෙනෙක් නිරත වන ආකාරය ඔහුගේ පුද්ගලික කැමැත්ත හා අකැමැත්ත පෙන්නුම් කරයි. මෙවැනි කැමැත්තේ හා අකැමැත්තේ බලපෑම් වලට ගොදුරු නොවන ලෙස ඉස්ලාමයේ විද්වතුන් උපදෙස් දෙති.

කෙනෙක් තම ආශාවන් පසු පස ලුහු බැඳීම නිසා නොයෙක් අයහපත් ක්‍රියාවන් ට සම්බන්ධ වෙයි. බිද්ආ වැනි ආගමෙ හි නොමැති නවීන දේ ඇතුළත් කිරීමේ ප්‍රධාන හේතුව මෙය වේ. ආගමෙන් සනාථ නොකළ හෝ සත්‍ය නොවන දේ අනුගමනය කිරීමෙන්, බිද්ආ ක්‍රියාවන් ඉටු කිරීම සිදු වේ.

ආගමික කටයුත්තක නිරත වන කෙනෙක් ආශාවන් හි බලපෑම් තිබෙනවා දැයි දැන ගන්නේ කෙසේද? ආගමෙ හි අත්‍යවශ්‍ය දැනුම ලබන්න ට අකැමැති වීමෙන් සහ නබි (සල්) තුමාණන්ගේ මග පෙන්වීම් වලට පිටු පෑමෙන් මෙය සිදු වන බව දැන ගත හැක.

මුස්ලිම් වරුන් ව ආශාවන්ගෙන් ඈත් ව තැබීම තුළින් ඔවුන් අල්ලාහ්ගේ අවංක ගැත්තන් බවට පත් කිරීම ෂරීආවෙහි අරමුණ බව ඉමාම් අල් ෂාතබි

(රහි) අල් මුවාෆකාත් නම් ග්‍රන්ථයේ සඳහන් කරයි. කෙනෙක් ෂරීආ නීතිය පැහැර හැර, තම ආශාවන් ඉටු කර ගනු පිණිස කපටිකම සහ වංචා ව උපයෝගි කරන විට ප්‍රශ්න පැන නගින බව එතුමා තව දුරටත් සඳහන් කරයි.

## කෙනෙකුගේ ආශාවන් පාලනය කර ගන්නා ක්‍රම

ෂරීආ නීතිය සහ එහි නියමය විනිශ්චය කරුවෙකු වශයෙන් ක්‍රියා කළ යුතු අතර සෑම මුස්ලිම් වරයෙකු ම එයට ගෞරවය දක්වා, එහි අගය තේරුම් ගෙන එයට අනුකූල ව කටයුතු කළ යුතු බව ඉමාම් අල් ෂාතබි (රහි) පවසයි.

කෙනෙක් අල්ලාහ්ගේ පැවැත් ම ගැන අවබෝධයෙන්, අවශ්‍ය දැනුම ලැබ, ඔහු ගැන නිතර සිහිකරමින් සිටිය යුතු යැයි තවත් විද්වතුන් පිරිසක් අදහස් දක්වති.

තෘෂ්ණාව සම්බන්ධ ව ක්‍රියා කිරීමේ මාර්ග 50ක් පිළිබඳ ව රව්දත් අල් මුහිබ්බීන් (ආදරවන්තයන්ගේ උයන) නම් ග්‍රන්ථයේ ඉමාම් ඉබ්නු කයියුම් සඳහන් කරයි. දැනටමත් තෘෂ්ණාවට භාජන වී සිටින ජනතාව එයට එරෙහි ව සටන් කිරීමට එම මාර්ග උපයෝගි කළ හැක. එවායින් 15ක් පහත සඳහන් වේ.

1. බලවත් අධිෂ්ඨානයක් තබා ගැනීම,
2. ඉවසීමෙන් සිටීම
3. සිත් ධෛර්යය සහිත ව සිටීම
4. තෘෂ්ණාවට භාජන වීමෙන් සිදු වන ප්‍රතිඵල ගැන කල්පනා කිරීම
5. මුස්ලිම්වරු උසස් අරමුණක් සඳහා මවන ලැබූ බව ද, තෘෂ්ණාව පාලනය නොකර අරමුණ ඉෂ්ට කළ නොහැකි බව ද මෙනෙහි කිරීම.
6. තෘෂ්ණවට වහල් නොවීම
7. අල්ලාහ් ගේ ගැත්තන් ට ෂෙයිතාන් සතුරෙක් බව වටහා ගැනීමද, මිනිසුන්ට බලපෑම් කිරීම පිණිස ෂෛයිතාන් ආශාව ආයුධයක් ලෙස උපයෝගි කරන බව දැන සිටීම.
8. ආශාවන් ඉෂ්ට කර ගැනීමෙන් කෙනෙකුගේ විනාශයට මාර්ග විවෘත වන බව ද අල්ලාහ්ගේ දඬුවම ලබන බව ද දැන සිටීම.
9. ආශාව මැඩපවත්වනු පිණිස වෑයම් කිරීම විශාල ජිහාදයකි. තෘෂ්ණාවට එරෙහි ව සටන් කිරීම ඉස්ලාමයේ ඉතා වැදගත් නිවේදනයකි. කුර්ආන් සහ සුන්නාහ්වට එකඟ ව ක්‍රියා කිරීමට හැකි

අයුරින් මහන්සි වන ලෙස මුස්ලිම් වරුන්ගෙන් අපේක්ෂා කෙරේ.

10. තෘෂ්ණාවන් හි ආභාසයට ලක් වීමට ඉඩ දෙන කෙනෙක් බුද්ධිමය සෙවිල්ලේ හැකියාව විනාශ කර ගනී.

11. සිය තෘෂ්ණාව පසුපසු ලුහු බඳින කෙනෙක්, යහ ක්‍රියාවන් ඉටු කිරීමේ ඕනෑකම දුර්වල කර ගනී. එමෙන් ම සිය තෘෂ්ණාව මැඩ පවත්වා ගැනීමෙන් කුසල් ක්‍රියාවන් ඉටු කිරීම සඳහා අධික ලෙස පොලඹවනු ලබයි.

12. තෘෂ්ණාවන් කෙරෙහි නොමඟ නොගිය කෙනෙක් මෙලොව ජීවිතයේ සහ මරණයෙන් පසු ජීවිතයේ ගෞරව සම්මානයෙන් පුදනු ලබයි.

13. තෘෂ්ණාව පසු පස ලුහු බැඳීමෙන්, ධාර්මික කටයුතු වලට නැඹුරු වූ සිත අසනීපයට ලක් වන අතර, ඒ සඳහා නිවාරණය තෘෂ්ණාව මැඩපවත්වා ගැනීමයි. සතුරා ට එරෙහි ව කරන සටන පවා සාර්ථක වන්නේ තෘෂ්ණව මැඩ පවැත්වීමෙන් පමණී.

14. කෙනෙකුගේ දේව විශ්වාසය ස්ථිර කර ගත හැකි වන්නේ දැනුම සෙවීමෙන් සහ අමතර සලාතයන් ඉටු කිරීමෙන් පමණි.

15. අල් කුර්ආනය සහ නබි (සල්) තුමාණන්ගේ සුන්නාහ්ව තුළින් යහ මඟ ලබා ගත යුතු බව අවබෝධ කර ගැනීම.

## අවසාන නිගමනය

මෙම හදීසය ඉතා වැදගත් කරුණක් පිළිබඳ ව සඳහන් කරයි. එනම් තම ඊමානය ශක්තිමත් කර ගනු පිණිස කෙනෙක් සිය තෘෂ්ණාව නොකඩවා පාලනය කර ගත යුතුය. අල්ලාහ් ප්‍රිය කරන දේ කෙරෙහි ආශා කිරීමෙන් සහ අල්ලාහ් අප්‍රිය කරන දේ කෙරෙහි පිළිකුල් කිරීමෙන් මෙම තත්ත්වය ලබා ගත හැකි වේ. උත්තරීතර අල්ලාහ්ගේ මාර්ගයේ පා තැබීමට මෙය වැදගත් කාර්යයකි. අල්ලාහ්ගේ සැබෑ බැතිමතෙක් හා අවංක සේවකයෙකු වීමේ ගෞරවය ද මෙලොව සහ මතු ලොවේ අල්ලාහ්ගේ සතුට ද ලබා ගත හැකි වේ.

සිය තෘෂ්ණාව පාලනය කර ගන්නට මුස්ලිම්වරු අවංක ව වෑයම් කළ යුතුය. මෙහි වැදගත් වන්නේ යමක් ආශා කිරීම හෝ පිළිකුල් කිරීම නොව, එයින් සිදු වන විපාකයයි. නිදසුනක් වශයෙන් අලුයම ෆජර් සලාතය සඳහා අදාන් හඬ සවන් දෙන කෙනෙක්

අධික නින්ද හෝ කම්මැළිකම හේතුවෙන් සලාත් සඳහා අවදි නොවීම දෙස බලමු. සෑම කෙනෙක් ම නින්ද ට කැමති නමුත්, මෙම ආශාව නිසා අනිවාර්‍යය නැමදුමක් ඉටු කිරීම අත පසු වීම හෝ ප්‍රමාද කිරීම සිදු වේ. හලාල් නොවන ආහාර, තවත් කෙනෙකුට අයත් මුදල් භුක්ති විඳීම වැනි ක්‍රියාවන් ද මේ හා සමාන වේ.

අප සිදු කරන සෑම ක්‍රියාවක ට ම විනිශ්චයකරු ලෙස ෂරීආ ව පත් කළ යුතුය. ඕනෑම පියවරක් ගන්නට පෙර මෙය බුද්ධිමත් එකක් ද? යනුවෙන් විමසිය යුතුය. මෙහිදී පිළිතුරු නැත යන්නේ නම්, අපි අනුගමනය කරන්නේ අපේම තෘෂ්ණාව යි. අල් කුර්ආනය අල් ෆුර්කාන්, වැරදි හා නිවැරදි අතර වෙන් කර පෙන්වීම (මිනුම් තලය) යනුවෙන් අල්ලාහ් නම් කළේ මේ නිසාය.

## 42.ක්‍ෂමාව දෙන්නා අල්ලාහ් තආලාය

තමන් මුහම්මද් නබි (සල්) තුමාණන් පවසනු ශ්‍රවණය කළ බව අනස් (රලි) මෙසේ වාර්තා කරයි. අල්ලාහ් තආලා මෙසේ වදාළයි. "ආදම්ගේ දරුවනි! ඔබ කොපමණ කාලයක් මගෙන් අයැද සිටිමින් මගේ උදව් උපකාරය ගැන පෙරුම් පුරා ගෙන සිටින්නේද, එතෙක් ඔබේ වැරදි සඳහා සමාව දෙමි. එය විශාල දෙයක් සේ නොතකමි. ආදම්ගේ දරුවනි! ඔබේ පාපය අහස් තලයේ තරම් උසට පිරී පැවතිය

ද, සමාව අයැදින විට ඔබේ පාපතර ක්‍රියා සඳහා ක්‍ෂමාව දෙමි. ඔබේ වැරදි පොළෝ තලය තරම් විශාල ලෙස පිරී තිබෙන තත්ත්වය යටතේ ඔබ මා හමුවට පැමිණිය ද ඔබ මට කිසිවකින් සමානයෙකු නොතබන තත්ත්වය යටතේ මා හමු වන්නේ නම් පොළෝ තලය තරම් විශාල ලෙස පිරී පවතින ඔබේ වැරදි සඳහා මා සමාව දෙමි." මූලාශ්‍ර තිර්මිදි.

## පසුබිම

මෙම හදීසයේ ප්‍රධාන නිවේදනය අවංක ව පාපක්‍ෂමා ව කරමින් උත්තරීතර අල්ලාහ්ගේ සමාව ලබා ගැනීමයි.

## ඉගෙන ගන්නා පාඩම

මුස්ලිම්වරයෙකුට අල්ලාහ්ගේ සමාව ලබා ගත හැකි මාර්ග තුනක් ඇත.

පළවුවන මාර්ගය අල්ලාහ්ගෙන් සමාව ඉල්ලා ප්‍රාර්ථනා කිරීම.

"නුඹලා මාගෙන් අයැදිවූ, මම නුඹලාට පිළිතුරු දෙන්නෙමි." යනුවෙන් අල්ලාහ් පවසයි. සූරා ගාෆිර් 40:වාක්‍ය 60

"නැමදුමෙහි සාරය (ආයාචනා) ප්‍රාර්ථනා කිරීම වේ." යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසුහ. මූලාශ්‍ර අත් තිර්මිදි.

“අල්ලාහ්ගේ ප්‍රතිචාරය කුමක් දැයි ඔබ දන්නා සේ අල්ලාහ් ට ප්‍රාර්ථනා කරනු මැනවි.” යනුවෙන් නබි (සල්) තුමාණන් පැවසුහ. සියලු දේවල ට සවන් දෙන අල්ලාහ් ඔබේ ප්‍රාර්ථනාව ඇතැම් කොන්දේසි මත භාර ගන්නා බව ද, ප්‍රතිචාර දක්වන බව ද පොරොන්දු වෙයි. ඒ සමග තම ප්‍රාර්ථනාව පිළි ගනු ලබනු පිණිස මුස්ලිම්වරයෙක් ඇතැම් ක්‍රියාවන්ගෙන් වැළකී සිටිය යුතුය. මෙවැනි කොන්දේසි පිළිබඳ ව මෙයට පෙර වූ හදීසයේ සඳහන් විය. මෙහි දී සම්පූර්ණයෙන්ම සිත යොමු කර, ස්ථිර විශ්වාසයෙන් යුතුව අල්ලාහ්ගෙන් ආයාචනා කිරීම ඉතා වැදගත් වේ.

දුආ කිරීම අඛණ්ඩ ක්‍රියාවක් වන අතර මුස්ලිම් වරයෙක් නිතර දුආ කළ යුතුය. මෙවැනි දුආවන් හි සියලු දේට සවන් දෙන අල්ලාහ් ගෙන් පාපයන් ට සමාව ද, අපාය ගින්නෙන් ආරක්ෂාව ද, ස්වර්ගය ට පිවිසෙන ජනතා අතර කෙනෙක් වීමේ භාග්‍ය ද සඳහන් විය යුතුය. අල්ලාහ් සාර්ථක ප්‍රතිචාරයක් දක්වන බවට ස්ථිර අපේක්ෂාවෙන් මුස්ලිම් වරයෙක් දුආ කළ යුතුය. “මගේ දාසයා බලාපොරොත්තු වන අයුරින් මම වෙමි.” යැයි හදීස් අල් කුද්සියක අල්ලාහ් පවසයි. මූලාශ්‍ර සහීහ් මුස්ලිම්.

කිසිදු මුස්ලිම් වරයෙකුගේ දුආවක් පාප ක්‍රියාවක් සඳහා හෝ නෑකම බිඳ දැමීම සඳහා හෝ නොමැති නම් අල්ලාහ් විකල්ප තුනක් අතර එකක් ඔහුට

අනුමත කරයි. ඔහුගේ දූආ සඳහා වහාම ප්‍රතිචාරය දෙනු ලබයි. නැතහොත් මරණයෙන් පසු ඔහුගේ දූආ සඳහා ප්‍රතිචාර දෙනු ලබයි. එසේත් නොමැති නම් ඔහු ගෙන් එය හා සමාන ප්‍රමාණයේ අයහපත් හෝ පාපයන් ඉවත් කරනු ලබයි. එවිට "ඔවුන් දිගින් දිගට දූආ කළේ නම් කුමක් සිදු වේ දැ?" යි සහාබාවරු විමසූහ. එයට නබි (සල්) තුමාණන්, "අල්ලාහ් ඔබ ට (විකල්ප) දෙකම දෙන්නේය." යැයි පිළිතුරු දුන්හ. මූලාශ්‍ර ඉමාම් අහ්මද්.

මෙහි දෙවැනි කොටසෙහි, අපි බොහෝ පාපයන් සිදු කර තිබුණත් පාප ක්ෂමාව කළේ නම් අල්ලාහ් ගෙන් සමාව ලැබෙනු ඇත. සමාව අයැද සිටීමෙ හි පසුතැවිලි වීමද සම්බන්ධ විය යුතුය. පසුතැවිලි වීම යනු එම පාප ක්‍රියාව වහාම නැවැත්වීම සහ අනාගතයේ එම පාපය නොකර එයින් ඉවත් වීමයි. සමාව ඉල්ලීම එක්තරා නැමදුම් මාර්ගයකි. සෑම දිනකම සෑම විටම මුස්ලිම් වරයෙක් ඉස්තිඃෆාර් කළ යුතුය. ඉස්තිඃෆාර් කරන ලෙස අපට අණ කර එසේ ඉස්තිඃෆාර් කරන්නන්ට අල්ලාහ් පැසසුම් කරයි.

*"තමන් හටම (පාපයන් හි යෙදීමෙන්) සීමාව ඉක්ම වූ මාගේ ගැත්තනි, අල්ලාහ්ගේ කරුණාවෙන් බලාපොරොත්තු සුන් නොකර ගනිවු. සැබැවින් ම අල්ලාහ් පාපයන් සියල්ල ක්ෂමා කරන්නේය. සැබැවින් ම ඔහුමය අති ක්ෂමාශීලී, පරම දයාබර වන්නේ."* සූරා (z)සුමර් 39:53

ඉස්තිඃෆාර් කිරීමෙ හි සහාබාවරුන් ට බොහෝ ක්‍රම වේදයන් නබි (සල්) තුමාණන් ඉගැන් වූහ. නබි (සල්) තුමාණන් දිනකට හැත්තෑ වරකට අධික ව අල්ලාහ්ගෙන් ඉස්තිඃෆාර් කළ බව එක් වාර්තාවක් දන්වයි. එතුමාණන් දිනකට සිය වාරයකට අධික ව ඉස්තිඃෆාර් කළ බව තවත් වාර්තාවක් සඳහන් කරයි. මේ හේතුවෙන් දිනකට සිය වරකට අධික ව ඉස්තිඃෆාර් කරන ලෙස මුස්ලිම් වරුන්ට නිර්දේශ කෙරේ. නබි (සල්) තුමාණන් කළ උතුම් ක්‍රමයේ ඉස්තිඃෆාර් පහත සඳහන් වේ.

“යා අල්ලාහ්! ඔබ මාගේ පරමාධිපතියාණන්ය, ඔබ හැර වෙනත් දෙවි කෙනෙක් නැත. ඔබ මාගේ නිර්මාණකරුය, මම ඔබගේ වහලා වෙමි. මට හැකි උපරිම ආකාරයෙන් ඔබගේ ප්‍රතිඥා ව සහ පොරොන්දුව අනුගමනය කරමි. මා කළ අයහපත් දේවලින් ඔබ වෙතම ආරක්ෂාව පතමි. මා හට දුන් තිළිණ ප්‍රසිද්ධියේ කියා සිටින අතර, මාගේ පාපයන් ගැන පාපෝච්චාරණය කරමි. මා හට සමාව දෙනු මැනව, ඔබ හැර අන් කිසි කෙනෙක් පාපයන් ට සමාව නොදෙන්නේය.”

“කවරෙකු මෙම ප්‍රකාශය ස්ථිර ව දහවල් කාලයේ පවසා සවස වේලාවට පෙර මිය යන්නේ නම්, ඔහු ස්වර්ග වාසියෙක් බවට පත් වෙයි. කවරෙකු මෙම ප්‍රකාශය ස්ථිර ව රාත්‍රි කාලයේ පවසා පසු දින උදය වේලාවට පෙර මිය යන්නේ නම්, ඔහු ස්වර්ග

වාසියෙක් බවට පත් වෙයි.” යනුවෙන් නබි (සල්) තුමාණන් ප්‍රකාශ කළහ. මූලාශ්‍ර අල් බුහාරි.

මුස්ලිම්වරු, විශේෂයෙන්ම අල්ලාහ්ගේ සැබෑ හා සමීප ව සිටින ගැත්තන් මෙම ඉස්තිඃෆාරය උදය ෆජර් සලාතයට පසුව සහ සවස හිරු බසින්නට පෙර දිනපතා පවසන ලෙස නිර්දේශ කෙරේ. රාත්‍රි යෙහි ඔවුන් කරන දුආවේ මෙය ද කොටසක් විය යුතුය. *“සැබැවින්ම, අල්ලාහ් ඔහු ට සමානයක් තැබීම කමා නොකරන්නේය. මෙය හැර අන් දැය ඔහු සිතු අයට කමා කරන්නේය. යමෙක් අල්ලාහ් ගැන සමානයක් තනන්නේද ඇත්තෙන්ම ඔහු වරදහිය, ඇත් වූ දුර්මාර්ගයෙහිය.”* සූරා අන් නිසා 4: වාක්‍ය116

ඒක දේව වාදය පාපයන් දිය කර ඉවත දමන බව විද්වතුන් පවසති. ඒක දේව වාදයේ අවශ්‍යයෙන්ම කළ යුතු සියලු දේ ඉටු කරන්නේ නම් මුස්ලිම් වරු සමාව දෙනු ලැබ ත්‍යාග ද ලබති. මුස්ලිම්වරු අල්ලාහ් ට ආදරය දක්වා, බිය බැතිමත් ව පැසසුම් කළ යුතු බව මෙයට පෙර ඉමාම් නවවි (රහ්) ගේ හදීසයක දුටුවෙමු. මුස්ලිම්වරු අල්ලාහ්ගෙන් පමණක් රැකවරණය පතා ඔහුගෙන් පමණක් සහය හා උපකාර පැතිය යුතුය. මේවා තව්හීද් හි වැදගත් ක්‍රියාවන් වන අතර, මේවා මගින් සිතෙ හි සම්පූර්ණයෙන්ම අල්ලාහ් ට පමණක් බැතිමත්කම දක්වන විට සැබෑ මුස්ලිම් වරයෙකු වන මුවහ්හිදීන් බවට ඔහු පත් වෙයි. එම අවස්ථාවෙ හි මුස්ලිම්වරු

සැබෑ අවබෝධ හා ප්‍රබෝධය ලැබ, ඔවුන්ගේ ඊමානය තවත් ශක්තිමත් වීමෙන් ඔවුන්ගේ පාපයන් ට සමාව දෙනු ලබති. ඒක දේව වාදය අවබෝධ කර ගැනීමෙන් මුස්ලිම් වරයෙකුගේ සිත උත්තරීතර අල්ලාහ් ට පමණක් කැප වීම නිසා පාපයන් කිරීමේ අවස්ථාව අවම කර ගනී.

සියලුම නබි වරුන්ගේ නිවේදනයේ ප්‍රධාන සාරය ඒක දේව වාදය විය. උත්තරීතර අල්ලාහ් එක් කෙනෙකු බව ද, ඔහුට පමණක් අවනත විය යුතු බව ද, නැමදුමට සුදුස්සා ඔහු පමණක් බව ද නිවේදනය සමඟ සියලු නබිවරු මෙලොවට පැමිණියහ. මුස්ලිම් වරු සියලු දෙනාම මෙම සත්‍යය සම්පූර්ණ ව පිළි නොගැනීම අවාසනාවකි. මළවුන්ගෙන් දුආ ඉල්ලා ඒ අයගේ නාමයෙන් සතුන් කැප කරන පිරිස් තවමත් සිටීම අවාසනාවකි. මෙවැනි ෂිර්ක් ක්‍රියාවන් හි නිරත වන ඔවුන් ඉස්ලාමයේ ප්‍රධාන නිවේදනය වන ඒක දේව වාදය උල්ලංඝනය කරති.

නූහ් (අලෛ) තුමාණන්ගේ ජනතාව, මළවුන් උත්කර්ෂයට පත් කර, ඔවුන් ව නියමිත තත්ත්වයට ඉහළින් නැං වූ විට, එම ජනතාව අල්ලාහ් ට සමානයක් තැබූ පාපයට ලක් වූහ. මෙලෙස මළවුන් උත්කර්ෂයට පත් කරමින් ඔවුන් පිළිමයන් බවට පත් කරනු ලැබූහ. අවසානයේ දී ඔවුන්ගේ විනාශය පවා සිදු වූයේ ඔවුන්ගේ ම ක්‍රියාවන් නිසාය.

ඒක දේව වාදයේ සාරය ගැන අනවබෝධයෙන් හෝ වරදවා අවබෝධ කර ගැනීමෙන්, අද බොහෝ මුස්ලිම්වරු පවා තහනම් ක්‍රියාවන් හි නිරත වීම අපි දකිමු. නොයෙක් හේතූන් මත ඔවුන්ගේ ඇතැම් ක්‍රියාවන් සඳහා අල්ලාහ් සමාව දෙන නමුත්, අල්ලාහ් අකැමැති මේ ක්‍රියාවන් ෂිර්ක් කරා මාර්ගය විවෘත කරයි. මෙවැනි වැරදි ක්‍රියාවන් හි යෙදෙන අය, තමන් කරන දේ ගැන අවබෝධය ලැබ ඒවායින් ඉවත් විය යුතුය. ඔවුන් පසුතැවිලි වී අල්ලාහ් වෙත පාප ක්‍ෂමාව කළ යුතුය. සමාව දිය හැක්කේ අල්ලාහ් ට පමණී. අප අනුගමනය කළ යුත්තේ අල්ලාහ්ගේ අණ පමණී.

මෙම හදිසයේ අවසාන කොටස ඒක දේව වාදය සාක්ෂාත් කිරීමේ වැදගත්කම පෙන්වා දෙයි. ඉමාම් නවවිගේ හදිස් වෙළුමේ අවසාන හදිසය මෙය බව සැලකිය යුතුය. මෙම හදීසයේ අවසාන කොටස, ඉස්ලාමයේ ඉතා වැදගත් කරුණක් වන තව්හිද් නම් ඒක දේව වාදය ගැන ලුහුඬින් පවසයි. මුස්ලිම් වරුන්ගේ ඒක දේව විශ්වාසය පිරිසිදු හා අවංක විය යුතු බව මෙම නිවේදනය තහවුරු කරයි. ඔවුන් කිසිවක් අල්ලාහ්ට සමාන නොකළ යුතුය. මෙ මගින් ඔවුන් වෙනත් පාපයන් ඉටු කර තිබුණ ද අල්ලාහ්ගේ සමාව ලැබීම නියත බව සහතික ලබති.

තව්හීදය සාක්ෂාත් කරනු පිණිස, අල්ලාහ් ගේ තීරණයට යටත් ව, ඔහු ට පමණක් නැමදුම් කර, ඔහු

ට අවනත වී, ඔහුගේ මග පෙන්වීම වලට එකඟ ව, පහත සඳහන් ක්‍රියාවන්ගෙන් ඉවත් ව ජීවත් විය යුතුය.

- වචනයෙන්, ක්‍රියාවෙන්, විවෘත හෝ සැඟවුණු ෂිර්ක්;
- අකීකරුවීම හා පාපයන් ඉටු කිරීම - පාපය කෙනෙකුගේ ඒක දේව විශ්වාසය දුර්වල කරයි;
- රියා - අල්ලාහ් වෙනුවෙන් නොව, තමන් හෝ අන් අය සතුටු කිරීම සඳහා ක්‍රියා කිරීම;
- තව්හීද් ය දුබල කරන බිද්අා නම් ආගමේ නොමැති නවක දේ හා අධර්මය සිදු කිරීම;
- මුනාෆිකූන් ගේ ක්‍රියා දහම වන කුහකකම් හි යෙදීම. ඒවා නම් පොරොන්දු ව ඉෂ්ට නොකිරීම, විශ්වාසය කඩ කිරීම, අසත්‍ය පැවසීම, අන් අයගේ අයිතීන් උල්ලංඝනය කිරීම, රන්ඩු දබර සහ ආරවුල් හි නිරත වීම වේ. පොදුවේ වංක භාවය, කපටිකම, ආක්‍රමණය වැනි පාපයන් ට මඟ පාදන සියලු නීති විරෝධි ක්‍රියාවන්ගෙන් මුස්ලිම්වරු ඉවත් විය යුතුය.

අවසාන නිගමනය:

අල්ලාහ්ගෙන් සමාව ලැබිය හැකි මාර්ග තුනක් පිළිබඳව මෙම හදිසය සඳහන් කරන නමුත් මේවාට පමණක් මාර්ග සීමා නොවන බව සලකන්න. මෙයට පෙර සඳහන් වූ හදීස් මගින් සමාව ලැබිය හැකි මාර්ග ගැන මුස්ලිම් විද්වතුන් සඳහන් කළහ. උදාහරණ වශයෙන් පීඩාවට ලක් වීම, බලවත් හිරිහැර වලට ලක් වීම, බලවත් රෝගයන්ට ගොදුරු වීම, සොහොනෙහි දඬුවම, විනිශ්චය දිනයේ දඬුවම, මහා පාපයන්ගෙන් ඉවත් වීම, ඉවසීමෙන් සිටීම, ඉස්ලාමයේ ප්‍රධාන කුලුනු ඉටු කිරීමේ දී නබි (සල්) තුමාණන් පෙන් වූ මාර්ගය අනුගමනය කිරීම, ආෂූරා සහ අරෆාත් දිනයන් හි අමතර උපවාසයේ යෙදීම, නබි (සල්) තුමාණන්ගේ සහ අල්ලාහ් අනුමත කළ අනිකුත් අයගේ මැදිහත් වීම යන කරුණු මෙහි අදාළ වේ.

සමාප්තයි

ඔබේ අදහස් පහත සඳහන් ලිපිනයට එවන්න.

sinhala@islamhouse.com